# 2022 ජුනි මස මාසික සභා රැස්වීමේ සංශිප්ත වාර්තාව

## තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව

**ස්ථානය - තිස්සමහාරාම ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව**
**දිනය - 2022.06.16**
**වේලාව - පෙ.ව. 10.00**

**පැමිණීම -**

| | | |
|---|---|---|
| I. | ඩබ්ලිව්.ජී. උපුල් මහතා | - ගරු සභාපති |
| II. | විදාන ගමගේ සුදත් මහතා | - ගරු උප සභාපති |
| III. | පී.එල්. චාලි ගුණරත්න මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| IV. | කේ.එච්. ගාමිණී මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| V. | හර්ෂ උදය කුමාර ජයවීර මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VI. | ඩබ්.කේ. ටෂිත සමිල මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VII. | ඒ.පී. ධම්මික මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VIII. | ආර්.රජිත ප්‍රියදර්ශන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| IX. | චතුමිණි විජේනායක මෙනවිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| X. | ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XI. | ආර්.කේ.එම්. රෝහිත මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XII. | එන්.ජී. සරත් මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XIII. | වයි.කේ. වසන්ත ප්‍රියදර්ශන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XIV. | චමින්ද ඩයස් වන්නිගේ මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XV. | ජී.එච්.ජී. නීටා මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XVI. | ඩබ්.කේ. සිසිර කුමාර මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |

**නොපැමිණීම -**

| | | |
|---|---|---|
| I. | පී.කේ. ආරියසේන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභි |
| II. | එල්.එච්. කුමුදු සුජීව මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| III. | කපිල ඉන්ද්‍රජිත් ශ්‍රීවර්ධන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| IV. | එම්.එල්.එම්. හනීෆා මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| V. | ඩබ්.කේ.කේ. ශාන්තිලතා මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VI. | වැල්ලගේ ජීවානි මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VII. | ඒ.ඩබ්. නන්දා මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |

ප්‍රථමයෙන්ම සියලුම දෙනා පංචසීලය සමාදන් වීමෙන් අනතුරුව, රට වෙනුවෙන් දිවිපිදූ විරෝධාර රණවිරුවන්ට, ප්‍රාදේශීය සභාවේ ධූර කාලය දරා, මේ වන විට මිය ගොස් ඇති බුද්ධදාස ජයසූරිය මහතා

ඇතුළු ගරු සභාපතිවරුන්ට, ගරු උප සභාපති ලෙස සිට මිය ගොස් ඇති ඩබ්.කේ. ප්‍රේමදාස මහතා හා අප සභාව නියෝජනය කළ ගරු සභික, එච්.ජේ.කේ.ජී. විජේරාම මහතාත්, ගරු සභිකවරුන් ඇතුළුව මියගිය සියලුම දෙනාට උපහාර දක්වමින්, විනාඩි දෙකක නිෂ්ශබ්දතාවය පළ කරන ලදී.

ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් 2022 වර්ෂයේ ජුනි මස මහා සභා රැස්වීම සඳහා පැමිණ සිටින ගරු උප සභාපති, ගරු ප්‍රාදේශීය සභා සභිකයින්, ලේකම්තුමිය, මාධ්‍යවේදී රංජිත් ඩයමන් මහතා, ඒ.ඒ. ප්‍රේමදාස මහතා ඇතුළු පිරිස පිළිගනිමින් න්‍යාය පත්‍රානුකූලව සභා කටයුතු ආරම්භ කරන ලදී.

**(අ) (i) 2022.05.17 වන දින පවත්වන ලද මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම.**

2022.05.17 දිනැති මහා සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සම්මත කරන ලෙස ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා යෝජනා කරන ලදී. 2022.05.17 දිනැති මහා සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සම්මත කරන බව ගරු ප්‍රාදේශීය සභා සභික ඩබ්.කේ. ටෂිත සමිල මහතා යෝජනා කළ අතර, ගරු උප සභාපති, සුදත් විදනගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>සංශෝධන</u>

I. <u>ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.පී. ධම්මික මහතා</u>

2022.05.17 මහා සභා වාර්තාවේ පිටු අංක 23 හි තම අදහස් දැක්වීම යටතේ සඳහන් අදහස, බස්නාහිර පළාතේ දිනකට ප්ලාස්ටික් ජල බෝතල් ලක්ෂ 05 කට වැඩි ප්‍රමාණයක් පරිසරයට මුදා හැරීම සිදු කිරීමෙන් දැඩි පරිසර දූෂණයක් සිදු වේ යැයි යනුවෙන් සංශෝධනය විය යුතුය.

II. <u>ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා</u>

2022.05.17 මහා සභා වාර්තාවේ පිටු අංක 21 හි තම අදහස් දැක්වීම යටතේ සඳහන් 2022.05.09 වන දින සිදු වූ ප්‍රචණ්ඩකාරී ක්‍රියාව මෙහෙයවන ලද මහ මොළකරුවන් මේ වන විට බියේ සැඟී ඇත. මේ සඳහා පොළඹවා ඇති පිරිස නීතියට අසු කර ගනිමින් සිටින බැවින්, මෙම ක්‍රියාව මෙහෙයවන ලද මහ මොලකරුවන් අනිවාරයෙන් නීතියේ රැහැනට අසු කර දීමට කටයුතු කළ යුතු බව ප්‍රකාශ කරන ලදී. එසේම මෙම ප්‍රචණ්ඩකාරී ක්‍රියාව මෙහෙයවන ලද සොෆ්ට් ලොජික් ආයතනයේ කළමනාකරු නීතියේ රැහැනට අසු කර දිය යුතු බවත්, ඔහුට මෙහි ඵල විපාක නිසැකවම ලැබන බවත් යනුවෙන් එකී අදහස සංශෝධනය විය යුතුය.

**(ආ) ගරු සභාපතිවරයා විසින් කරනු ලබන නිවේදනය -**

I. ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා, ඒ.ඩබ්. නන්දා මහත්මිය, වැල්ලගේ ජීවානි මහත්මිය
ගරු සභික, එල්.එච්. කුමුදු සුජීව මහතා ද අද දින නිවාඩු ලෙස දන්වමින් ලිපියක් ලබා දී තිබිණද, පසුගිය මැයි 09 වන දින සිදු වූ ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන්ට ඔහුද සම්බන්ධ වී ඇති බැවින් සහ පොලිස් පරීක්ෂණවලට සම්බන්ධ සැකකරුවකු බැවින්, අද දින ඔහුගේ නිවාඩු අනුමත කළ නොහැකි බව ගරු සභිකයින් සියලු දෙනා ඒකමතිකව තීරණය කර සිටින ලදී.

එසේම මේ පිළිබඳව පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය වෙත දන්වා, මේ සම්බන්ධයෙන් පවතින නෛතික ක්‍රියාවලිය සොයා බැලීම සිදු කරන ලෙසටත් ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

**(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සංනිවේදන**

I. දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් අංක දප/අදෙ/සැල/01/07 හා 2022.02.09 දිනැතිව ''ග්‍රාමීය ප්‍රාථමික පාසල් සංවර්ධන වැඩසටහන-2021 යටතේ සංවර්ධනය කරනු ලබන පාසල්වල

නම සංශෝධනය කිරීම'' යන මැයෙන් යුතුව, හ/විද්‍යාර්ථ මහා විද්‍යාලයේ නාමය වෙනස් කිරීම සම්බන්ධයෙන් පළාත් පාලන ආයතනයේ අනුමැතිය ලබා දෙන ලෙසට ඉල්ලා ඇති ලිපිය ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් හ/විද්‍යාර්ථ මහා විද්‍යාලයේ නාමය වෙනස් කිරීම සම්බන්ධයෙන් පළාත් පාලන ආයතනයේ අනුමැතිය ලබා දෙන ලෙසට ලිපියක් මගින් ඉල්ලා තිබුණද, සංශෝධනය කළ යුතු නාමය එකී ලිපියේ සඳහන්ව නොමැති නිසා, ඒ සඳහා අප ආයතනයේ එකඟතාවයක් ලබා දිය නොහැකි බැවින්, සංශෝධනය විය යුතු නම ඇතුළත් කර නැවත ලිපියක් ලබා දෙන ලෙසට දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත ලිපියක් මගින් දන්වා යවන ලෙසට ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.</u>

II. දකුණු පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් අංක 4/04/03 හා 2022.06.09 දිනැතිව එවා ඇති ලිපිය මගින්, පළාත් පාලන බල ප්‍රදේශ තුළ පැවැත්වෙන එළිමහන්/ගෘහස්ථ සංගීත සංදර්ශනවල භාවිතා කෙරෙන ගීත වෙනුවෙන් කර්තෘභාග මුදල් ගෙවීම් කරන ලෙසට දන්වා ඇති බව ගරු සභාපතතුමා විසින් දන්වා සිටින ලදී.

III. දකුණු පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙතින් අංක 03/02 හා 2022.06 දිනැති ලිපිය පරිදි, ඉදිරියේ දී මුහුණ දීමට සිදු වන ආහාර අර්බුදයට මුහුණ දීම සඳහා රාජ්‍ය ආයතන සතු ඌණ උපයෝජිත ඉඩම් ඒ සඳහා යොදා ගන්නා ලෙසට දන්වා ඇති බව ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>ඉදිරියේ දී මුහුණ දීමට සිදු වන ආහාර අර්බුදයට විසඳුම් සෙවීම සඳහා ආහාර බෝග වගාව සිදු කිරීම සඳහා, අප ආයතනයට අයත් කොම්පෝස්ට් මධ්‍යස්ථානය යොදා ගැනීමට උපදෙස් ලබා දී ඇති. එසේම මේ සම්බන්ධයෙන් ප්‍රජා මණ්ඩල හරහා ද ආහාර බෝග වගා සිදු කරන ලෙසට එම ප්‍රජා මණ්ඩල දැනුවත් කරන ලෙසටත් ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.</u>

IV. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ ප්‍රජා පහසුකම් කාරක සභාව මගින් ජනතාව උදෙසා ප්‍රජා සත්කාරක වැඩසටහන් රැසක් වන ජනතාවගේ ගැටළු නිරාකරණය කිරීම සඳහා ජංගම සේවා පැවැත්වීම, දිළිඳු පවුල් සඳහා වැසිකිළි ආධාර ලබා දීම, කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ නිරෝධායනය වන පවුල් සඳහා වියළි ආහාර ලබා දීම, කොවිඩ් එන්නත් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම, ගම්මාන සඳහා පානීය ජලය බෙදා දීම, ආයුර්වේද වෛද්‍ය සායන පැවැත්වීම ආදි කාර්යයන් රැසක් පසුගිය වසර තුළ සිදු කරන ලද අතර, එකී වැඩසටහන් සියල්ල සඳහා සහයෝගය ලබා දුන් ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු විපක්ෂ නායකතුමා හා සියලුම ගරු සභිකයින් ඇතුළු කාර්ය මණ්ඩලය සහ කමිටු සාමාජිකයින් වෙතත් නිවාස හා ප්‍රජා පහසුකම් කාරක සභාවේ සභාපති, ගරු සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා වෙතත් තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ ස්තුතිය පිරි නමන ලදී.

V. දකුණු පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් එවා ඇති ලිපිය පරිදි, පළාත් පාලන ආයතනවල සියලුම ගරු සභිකයින්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ 2022.06.30 දිනට හෝ ඊට පෙර ලබා දෙන ලෙස දන්වා ඇති බව ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>සියලුම ගරු සභිකයින් වෙත අද දින වත්කම් බැරකම් ප්‍රකාශ ලබා දී ඇති බැවින්, එය සම්පූර්ණ කර 2022.06.30 දිනට පෙර ලබා දීමට කටයුතු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් සියලුම ගරු සභිකයින් වෙත දන්වා සිටින ලදී.</u>

VI. තිස්සමහාරාම, අකුරුගොඩ හන්දිය, අංක 36 දරණ ලිපිනයේ පදිංචි එල්.එච්.එස්.පී. කුමාර මහතා ලිපියක් මගින්, ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය අංශයේ සේවකයින් සඳහා දිවා ආහාර පාර්සලයක් මේ වන තෙක් රු. 70.00 ක මිලකට ලබා දුන්නද, පවතින ආර්ථික අර්බුදය හමුවේ සියලුම ද්‍රව්‍යවල මිල ඉහල යාමත් සමඟ බත් පාර්සලයක් රු. 70.00 මිලකට ලබා දීමට නොහැකි බැවින්, ලබා දෙන බත් පාර්සලයේ මිල වැඩි කර දෙන ලෙසට ඔහු විසින් දන්වා ඇති බව ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>සභාවේ අයවැය මගින් සෞඛ්‍ය අංශයේ සේවකයින් සඳහා ලබා දෙන දිවා ආහාරයට මුදල් ප්‍රතිපාදන වෙන් කර ඇති නමුත්, දැනට බත් පාර්සලය ලබා දෙන පුද්ගලයා විසින් කෑම පාර්සයේ මිල ඉහල දැමීමට කරන ලද ඉල්ලීමට ඉටු කිරීම සඳහා, මේ සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන මුදල් ප්‍රමාණවත් නොවන බැවිනුත්, මෙම කාර්යය අනිවාරයෙන්ම සිදු කළ යුතු කාර්යයක් වන බැවිනුත්, දැනට ලබා දෙන රු. 70.00 කෑම පාර්සලය රු. 80.00 ක් දක්වා වැඩි කර, ඒ සඳහා අමතරව වැය වන මුදල් වෙනත් ප්‍රතිපාදන මගින් හෝ ලබා ගෙන මෙකී කාර්යය සිදු කිරීමට ගරු සභාපතුතිමා විසින් උපදෙස් ලබා දෙන ලදී.</u>

<u>අප ආයතනයේ සෞඛ්‍ය අංශයේ සේවකයින් අති මහත් සේවයක් සිදු කරන පිරිසකි. අප සමාජයේ ජනතාව ජීවත් වන පරිසරය ඉතාමත් සුන්දර, පිරිසිදු පුරවරයක් කිරීමට කැප වී කටයුතු කරන පිරිසකි. එවැනි සේවකයින් පිරිසක් සඳහා මිල ඉහල දැමීමක් සිදු වුවත් ඔවුන් වෙත ලබා දෙන කෑම පාර්සලය අනිවාරයෙන්ම ලබා දීම සිදු කළ යුතුය.</u>

<u>එසේම පවතින ආර්ථික අර්බුදකාරී තත්ත්වය හමුවේ වුවත් මේ දක්වා රු. 70.00 ක මුදලකට අප ආයතනයේ සෞඛ්‍ය අංශය සඳහා කෑම පාර්සලක් ලබා දීමට කටයුතු කිරීම වෙනුවෙන් තිස්සමහාරාම, අකුරුගොඩ හන්දිය, අංක 36 දරණ ලිපිනයේ පදිංචි එල්.එච්.එස්.පී. කුමාර මහතා වෙත අප ආයතනයේ ස්තූතිය සහ ප්‍රණාමය පුද කර ලිපියක් යොමු කිරීමට තීරණය විය.</u>

VII. එක්සත් ජාතික පක්ෂයේ මහ ලේකම් පාලිත රංගේ බණ්ඩාර මැතිතුමාගේ අත්සනින් යුතුව 2022.05.13 දිනැතිව එවා ඇති ලිපිය පරිදි, තිස්සමහාරාම ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි විජේනායක කෝරලේ කංකානම්ගේ ශාන්තිලතා මහත්මිය එක්සත් ජාතික පක්ෂ සාමාජිකත්වය 2022.05.05 වන දින සිට අහෝසි කොට පක්ෂයෙන් නෙරපා හැරීමට එක්සත් ජාතික පක්ෂය විසින් තීරණය කොට ඇති බව ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

VIII. එක්සත් ජාතික පක්ෂයේ මහ ලේකම් පාලිත රංගේ බණ්ඩාර මැතිතුමාගේ අත්සනින් යුතුව 2022.05.13 දිනැතිව එවා ඇති ලිපිය පරිදි, තිස්සමහාරාම ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහම්මද් ලාහිරීන් මොහම්මද් හනීෆා මහතා එක්සත් ජාතික පක්ෂ සාමාජිකත්වය 2022.05.05 වන දින සිට අහෝසි කොට පක්ෂයෙන් නෙරපා හැරීමට එක්සත් ජාතික පක්ෂය විසින් තීරණය කොට ඇති බව ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

**(ඇ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න -**

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා -**

- **<u>ගරු සභාපති විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනා</u>**

01. ලිපි ශිර්ෂ හා වර්ණ ලිපි ගොණු කවර මුද්‍රණය කර ගැනීම වෙනුවෙන් 2022.05.05 දිනැති 220502 අංක දරණ බිල්පත සඳහා රු. 105,000.00 ක මුදල බෙල්කෝ ඔෆ්සෙට් ප්‍රින්ටර්ස් ආයතනය වෙත ගෙවීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

02. දෙබරවැව පොදු ක්‍රීඩාංගනය 2022.05.01 දින සිට ක්‍රීඩා කටයුතු සඳහා පමණක් ලබා දෙන අතර, සංගීත ප්‍රසංග වෙළඳ සැණකෙළි හා උත්සව සඳහා ලබා නොදෙන බවත්, සංගීත ප්‍රසංග, වෙළඳ සැණකෙළි හා උත්සව පැවැත්වීම සඳහා 2022.05.01 දින සිට පන්නෙගමුව ගොවි සෙවණ ක්‍රීඩාගනය ලබා දීම සුදුසු බවටත් මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.එල්. වාලි ගුණරත්න මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා</u>

සෑම වැඩසටහනක් සඳහාම නොමැතිව, විශේෂ වැඩසටහන්, සංගීත සංදර්ශන සඳහා ලබා දීම සුදුසු වන බවත්, එය එසේ ලබා දීමේ දී වසර මුළුල්ලේම ලබා නොදී වසරකට වැඩසටහන් 02, 03 ක් වන පරිදි ලබා දීම සුදුසු වන බවට දන්වා සිටින ලදී. දිනපතා, මාසිකව එලෙස වැඩසටහන්, සංගීත ප්‍රසංග සඳහා ලබා දීමට කටයුතු කළහොත්, ක්‍රීඩාංගනය දැඩි ලෙස හානි වීමට ඉඩ පැවැතිය හැකිය. එසේම ක්‍රීඩා කරන අයට ක්‍රීඩා කිරීම සඳහා ක්‍රීඩාංගනයේ පවතින පිච් එකට හානි සිදුවුවහොත් ක්‍රීඩා කිරීමට නොහැකි වනු ඇත. එම නිසා, යම් වැඩසටහනක් සඳහා දෙබරවැව ක්‍රීඩාංගනය ලබා දුන්හොත්, පිච් එකට සිදුවන හානියට විසඳුමක් ලබා දිය හැකි නම්, දෙබරවැව ක්‍රීඩාංගනය වෙනත් කටයුතු සඳහා ලබා දීම සුදුසු වන බව ප්‍රකාශ කර සිටින ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා</u>

දෙබරවැව ක්‍රීඩාංගනය ක්‍රීඩා කටයුතුවලට හැර වෙනත් කටයුතු සඳහා ලබා දුන්හොත්, ක්‍රීඩා කිරීම සඳහා තිබෙන පිච් එකට හානි සිදුවිය හැකිය. කෙසේ වුවත් වෙනත් කටයුතු සඳහා ක්‍රීඩාංගනය ලබා දුන් පසුව පිච් එකට සිදු වන හානියට ගාස්තුවක් අය කර, එකී හානිය අවම ගැනීමට හැකි නම් ලබා දීම සම්බන්ධයෙන් විරෝධතාවයක් නොමැති බව දන්වා සිටින ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, හර්ෂ ජයවීර මහතා</u>

දෙබරවැව ක්‍රීඩාංගනය ක්‍රීඩා කටයුතුවලට හැර, වෙනත් වැඩසටහන් සඳහා ලබා දෙන්නේ නම්, ක්‍රීඩාංගනය ලබා දීමේ දී අදාළ වන කොන්දේසි ඉල්ලුම්කරුවන් වෙත පැහැදිලිව දැනුවත් කර, ලබා දීම සුදුසු වන බව ප්‍රකාශ කර සිටින ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා</u>

ක්‍රීඩාංගනය යම් සංගීත ප්‍රසංගයක් සඳහා ලබා දුන් පසුව, එයට යම් හානියක් සිදු වී එය සකස් කර දීමට කටයුතු කරන ලෙස දැන්වූ පසුව, ලබා ගන්නා පුද්ගලයින් එමගින් ලාභයක් තිබුණත් කිසිදු ලාභයක් නොලැබූ බව දන්වනු ලබයි. එම නිසා දෙබරවැව ක්‍රීඩාංගනය වෙනත් වැඩසටහන් සඳහා ලබා දෙන්නේ නම්, එම වැඩසටහන් වලින් ලාභයක් හෝ අලාභයක් සිදු වුවත්, ක්‍රීඩාංගනයේ හානිය වෙනුවෙන් ලබා ගත යුතු මුදල් අනිවාරයෙන්ම ලබා ගැනීම සඳහා ද කොන්දේසියක් දැමිය යුතුය.

එසේම, යම් වැඩසටහනකදී ක්‍රීඩාංගනයට හානියක් සිදු වුවහොත්, එය නැවත සකස් කිරීම තාක්ෂණ සේවා නිලධාරී වාර්තා නොමැතිව ඔවුන් විසින්ම සකස් කිරීමට ඉදිරිපත් වුවහොත්, එය නිසි ක්‍රමවේදයකට අනුව සකස් වීමක් සිදු නොවේ. එම නිසා එවැනි අවස්ථාවකදී යම් සකස් කිරීමක් සිදු කරන්නේ නම්, තාක්ෂණ සේවා නිලධාරී වාර්තාවන් ලබා ගෙන සිදු කළ යුතු බවටත් අදාළ ඉල්ලුම්කරුවන් වෙත දැන්වීම කළ යුතුය.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>දෙබරවැව පොදු ක්‍රීඩාංගනය ක්‍රීඩා කටයුතුවලට හැර වෙනත් උත්සව, වැඩසටහන්, සංගීත ප්‍රසංග සඳහා ලබා දීමට ගනු ලබන තීරණයේ දී, යම් වැඩසටහනකදී ක්‍රීඩාංගනය සඳහා සිදුවන සියලු අලාභ හානි ඇතුළත් වාර්තාවක් සකස් කර, එකී වාර්තාවට අනුව, ඉදිරියේ දී මෙකී වැඩසටහන් සඳහා දෙබරවැව පොදු ක්‍රීඩාංගනය ලබා දීම සුදුසු බවටත්, වැඩසටහන් පැවැත්වීමෙන් පසුව ක්‍රීඩා පිටියේ පිච් එක වතුර</u>

දමා නිසි පරිදි සකස් කිරීමේ කොන්දේසියට යටත්ව ක්‍රීඩාංගනය ලබා දීම සුදුසු බවටත් අද දින සියලුම දෙනා ඒකමතිකව තීරණය කරන ලදී.

එසේම, යම් වැඩසටහනක් සඳහා ක්‍රීඩාංගනය ලබා දීමේ දී වැඩසටහනට පෙර දින ක්‍රීඩාංගනය පවතින තත්ත්වය සහ වැඩසටහනින් පසු ක්‍රීඩාංගනයේ පවතින තත්ත්වය පිළිබඳ වාර්තාවන් ලබා ගැනීම කළ යුතුය. එසේ පෙර වාර්තාවන් ලබා ගත් පසු, එකී වාර්තාවට අනුව වැඩසටහිනන් පසුව ක්‍රීඩාංගනයට සිදු වූ අලාභයන් සකස් කිරීම කළ හැකි වන බවත් ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එසේම, අද දින සාකච්ඡා වූ කරුණු සියල්ල පදනම් කර ගනිමින්, යම් වැඩසටහනක් සඳහා ක්‍රීඩාංගනය ලබා දීමේදී ක්‍රීඩාංගනයට සිදු වන සියලුම අලාභයන් සඳහා මුදල් ගෙවීමේ එකඟතාවය මත ලබා දීම සුදුසු වන බැවින්, මෙයට අදාළ කොන්දේසි ඇතුළත් වාර්තාවක් සහ තාක්ෂණ සේවා නිලධාරී වාර්තාවන් සාකච්ඡා කර ලබා ගැනීම සඳහා පහත නම් සඳහන් ගරු සභිකයින්ගෙන් සහ නිලධාරීන්ගෙන් යුත් කමිටුවක් පත් කරන අතර, එකී කමිටුව හරහා ඊට අදාළ සියලු කරුණු සාකච්ඡා කර තීරණයක් ලබා ගන්නා ලෙසටත් තීරණය කරන ලදී.

එසේම, මෙම කමිටුව හරහා සංගීත ප්‍රසංග සඳහා ලබා දෙන බිම් බදු මුදල තීරණය කිරීම සුදුසු වන බවත් දන්වා සිටින ලදී.

- ගරු උප සභාපති - සුදත් විදානගමගේ මහතා
- ගරු ප්‍රාදේශීය සභා සභික - ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා
- ගරු ප්‍රාදේශීය සභා සභික - ඩබ්.කේ. ටෂිත සමිල මහතා
- ගරු ප්‍රාදේශීය සභා සභික - කේ.එච්. ගාමිණී මහතා
- තාක්ෂණ සේවා නිලධාරී - එල්.පී. ජගත් කුමාර මහතා
- සංවර්ධන නිලධාරී - වයි.ජී.එම්. නිරාෂා මිය
- ආදායම් පරීක්ෂක - එස්.ඒ. අරුෂි ප්‍රසංගිකා මිය

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

03. ප්‍රාදේශීය සභාව සතු රථවාහන සඳහා අමතර කොටස් ලබා ගැනීම, රක්ෂණ කිරීම හා අලුත්වැඩියා කිරීම වෙනුවෙන් ගෙවීම් අනුමැතිය ලබා දීමට මෙම ගරු සභාව යෝජනා කරමි.

උප ලේඛනය

ගෙවීම් විස්තරය

| අනු අංකය | විස්තරය | ගෙවනලද/ගෙවීමට ඇති ආයතනය | බිල්අංකය සහ දිනය | මුදල (රු.) |
|---|---|---|---|---|
| I | RD-9489 ට්‍රැක්ටර් රථය ඔයිල් ෆිල්ටර්, ඩීසල් ෆිල්ටර් යොදා පූර්ණ සේවා කිරීම | රෝහණ ඔටෝ සර්විස් තිස්සමහාරාම | 675<br>2022.05.05 | 55,585.00 |
| II | සභාව සතු රථවාහන රක්ෂණ කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම | ෆෙයාෆස්ට් ඉන්ෂුවරන්ස් ආයතනය | 2022.05.24 | 211,269.00 |
| III | ZB-0413 කම්පැක්ටර් රථය සඳහා 900x20 ප්‍රමාණයේ ටයර් 02, ටියුබ් 02, රිම්ටේප් 02 මිලට ගැනීම | පෙරේරා ටයර් සර්විස් මාළඹේ | JCJJ008639<br>2022.06.02 | 157,300.00 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, වයි.කේ. වසන්ත ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

❖ <u>රීති අංක 11 (8) යටතේ ඉදිරිපත් කරන ලද යෝජනා</u>

- <u>ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

04. සභාව සතු ගලි බවුසරය 2013.01.15 දින සිදු වූ අනතුර සම්බන්ධව සභාව වැරදිකරු කරමින් පවරා ඇති නඩුව මේ වන තුරු විභාග වෙමින් පවතී. එම නඩුව සමථයකට පත් කිරීම සඳහා සභා අරමුදලින් රු. 400,000.00 (ලක්ෂ හතර) ක මුදලක් ලබා දෙන ලෙස LAC/Tissa/others/011/2022 හා 2022.05.26 දිනැති ලිපිය මගින් ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවෙන් ඉල්ලීමක් කර ඇත. ඒ පිළිබඳ විමසා බලා කටයුතු කිරීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.එල්. චාලි ගුණරත්න මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

ගලි බවුසරයේ සිදු වූ අනතුරු සම්බන්ධයෙන් පවරා ඇති නඩුව සමථයකට පත් කිරීම සඳහා නීති ආධාර කොමිෂන් සභාව විසින් රු. 400,000.00 ක මුදලක් ලබා දෙන ලෙසට ඉහත ලිපියක් මගින් ඉල්ලා තිබුණද, එකී මුදල ගෙවීමට අප ආයතනයට කිසිදු හැකියාවක් නොමැති අතර, මෙලෙස නීති ආධාර කොමිෂන් සභාව විසින් ගෙවීම් කරන ලෙස දැන් වූ මුදලක් සඳහා ගෙවීම් කළහොත් අප සභාව අධි භාරයටද ලක් විය හැකිය. එම නිසා අද දින සියලුම දෙනාගේ ඒකමතික තීරණය අනුව මෙම මුදල අප ආයතනයට ගෙවීමට කිසිදු හැකියාවක් නොමැති නිසා, ගෙවීම් කළ නොහැකි බවට තීරණය කරන ලදී.

එසේම, මෙම නඩුව සඳහා මේ වන තෙක්ම නීතිඥ ගාස්තු ද ගෙවනු ලබයි. මෙම අනතුරේ දී අප සභාවේ රියදුරු මහතාගේ කිසිදු වැරැද්දක් නොමැතිව අනතුරට ලක් වූ ත්‍රීවීලර් රථයේ රියදුරු මහතා එම අවස්ථාවේ බීමත්කමින් සිටියදීත්, සභාව වැරදිකරු කරමින් මෙම පැමිණිල්ල කුමන කරුණු පදනම් කර ගනිමින් ගොණු කර ඇත්ද යන්න සොයා බැලිය යුතු කරුණක් බවත් දන්වා සිටින ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05. රටතුල උද්ගත වී ඇති දැඩි ආර්ථික ගැටළු හා ඉන්ධන නොමැතිවීම හේතුවෙන් දේශීය සංචාරකයින් හා බැතිමතුන්ගේ පැමිණීමේ අඩුවක් පූජා නගර හා ඒ අවට පැවතීම හේතුවෙන් රථ වාහන නැවතුම්පල හා පොදු වැසිකිළිය ආදායම් අඩු වී ඇති බවට අදාළ බදුකරුවන් ඉල්ලීම් ලිපි මගින් ලබා දී ඇති බැවින්, ඒ සම්බන්ධව ආදායම් පරීක්ෂක නිලධාරී විසින් ද වාර්තා මඟින් පෙන්වා දී ඇති බැවින්, 2022 වර්ෂය සඳහා පහත ටෙන්ඩර් දේපල වෙනුවෙන් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු, අදාළ බදුකරුවන් වෙත සහන ලබා දීම සුදුසු බවට මෙම මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | දේපළ විස්තරය | මාසික බදු වාරික මුදල (රු) | මේ වන තෙක් ගෙවා ඇති බදු වාරික ගණන | හිඟ බදු වාරික මුදල (රු) |
|---|---|---|---|---|
| 01 | පන්නෙගමුව පොදු වෙළඳපොළ හා වැසිකිළිය | 137,000.00 | 03 (පෙබ, මාර්, අප්‍රේල්) | 137,000.00 |
| 02 | දෙබරවැව පොදු වෙළඳපොළ හා වැසිකිළිය | 173,181.82 | 02 (පෙබ, මාර්) | 346,363.64 |
| 03 | කිරින්ද පූජා නගර පැරණි හා නව වැසිකිළිය | 9,000.00 | 05 | (හිඟයක් නොමැත) |
| 04 | තිස්සමහාරාම බස්නැවතුම්පොළ නව වැසිකිළිය | 1,270.84 | 05 | (හිඟයක් නොමැත) |
| 05 | කිරින්ද වෙරළ වැසිකිළිය හා නාන ස්ථානය | 13,808.34 | 03 (ජන, පෙබ, මාර්තු) | 27,616.68 |
| 06 | තිස්සමහාරාම පූජා නගර වැසිකිළිය | 11,492.50 | 04 (ජන, පෙබ, මාර්, අප්‍රේල්) | 11,492.50 |

| | | | | |
|---|---|---|---|---|
| 07 | අකුරුගොඩ හන්දිය කඩ කාමර අසල නව වැසිකිළිය | 325.00 | 12 | (මුළු වාරික ගණනම ගෙවා ඇත) |
| 08 | තිස්සමහාරාම පූජා නගර රථවාහන නැවතුම්පොළ | 41,323.50 | 04<br>(ජන, පෙබ, මාර්, අප්‍රේල්) | 41,323.50 |
| 09 | කිරින්ද පූජා නගර රථවාහන නැවතුම්පොළ | 100,642.50 | 05<br>(ජන, පෙබ, මාර්, අප්‍රේල්, මැයි) | (හිඟයක් නොපවතී) |
| 10 | කිරින්ද පොදු වෙළඳපොළ | 3,750.00 | කිසිදු වාරිකයක් ගෙවා නොමැත | 18,750.00 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා</u>

තිස්සමහාරාම පූජා නගර රථවාහන නැවතුම්පොළ ගැටළු රැසක් පවතී. තිස්ස වැව් කණ්ඩියේ වාහන නතර කළ පසු ආදායම් අය කරන බවට දන්වා පුවරු කිහිපයක් සවි කර තිබුණද, එම පුවරු මේ වන විට ගලවා ඉවත් කර ඇත. එසේම ජංගම වෙළඳුන් විසින් මෙහි පහසුකම් නොමැති නිසා බදු මුදල් ලබා නොදෙන ලෙසට වාහනවලට දැනුම් දීම් සිදු කරනු ලබන බව, බදු අය කරන පුද්ගලයා වෙත වාහනවලින් විවිධ දෝෂාරෝපණ එල්ල කරනු ලබන බවත්, බදුකරු විසින් ඒ පිලිබඳව මා වෙතද කරුණු සැල කරන බැවින්, මෙකී කරුණු සම්බන්ධයෙන් සොයා බලන ලෙසට ඉල්ලා සිටින ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>2022 වර්ෂය සඳහා බදු අයිතිය ලබා දෙන ලද සති පොළවල් 02, රථවාහන නැවතුම්පොළවල් 02 සහ පොදු වැසිකිළි සඳහා ආදායම් පරීක්ෂක නිලධාරී සහ වෙළඳපොළ පරිපාලක වෙතින් නිශ්චිත වාර්තා ලබා ගෙන, 2022 අප්‍රේල්, මැයි සහ ජූනි මාසයන් සඳහා බදු සහන ලබා දීමට ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කර, අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට තීරණය විය.</u>

<u>එසේම තිස්ස වැව් කණ්ඩියේ සවි කර ඇති පුවරු ගලවා ඉවත් කිරීම සම්බන්ධයෙන් තාක්ෂණ සේවා නිලධාරී වාර්තාවක් ලබා ගැනීමටත්, ජංගම වෙළඳුන් විසින් සභාවට ලැබෙන ආදායම අහිමි කර දැමීමට සිදු කරන ක්‍රියාවන් සම්බන්ධයෙන් පොලිස් ස්ථානය දැනුවත් කිරීමටත් තීරණය විය.</u>

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

06. සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල් ආදායම් වාර්තා ඉදිරිපත් නොකිරීම සහ ඒවායේ ආදායමින් 1% ක මුදල නොගෙවා ව්‍යාපාර බලපත්‍රයක් ලබා නොගැනීම හේතුවෙන්, තිස්සමහාරාම මහේස්ත්‍රාත් අධිකරණය මගින් නඩු පැවරීම සහ එම නඩුවලට පෙනී සිටීම සඳහා නීතිඥවරයෙක් වශයෙන් නීතිඥ සම්පුධීන් මහතා පෙනී සිටීම සඳහා තෝරා ගැනීමට සහ එම අදාළ නීතිඥ ගාස්තු ගෙවීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>ඉහත නඩුව ගොණු කර ඇත්තේ බලපත්‍රයක් නොමැතිව ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම වෙනුවෙන් වන බැවින්, බලපත්‍රය ලබා ගැනීමට පැමිණි පසු 1% ආදායම අනිවාර්යයෙන්ම ගෙවිය යුතු බවත් දන්වා සිටින ලදී.</u>

<u>ඊළඟ නඩු වාරය සඳහා නීතිඥ සම්පුධීන් මහතා සම්බන්ධ කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසට උපදෙස් ලබා දෙන ලදී.</u>

එසේම සභාවේ සියලුම නඩු සඳහා පෙනී සිටීමට නීතිඥ ගුණසෝම වික්‍රමසිංහ මහතා, සුරංග වන්නිආරච්චි මහතා, සුනිල් ගුණසේකර මහතා නම් කිරීම සුදුසු බවටත් තීරණය විය.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

07. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව මගින් දෛනික පදනම මත සේවයේ යොදනා ගන්නා කම්කරුවන් 10 ක් හා රියදුරන් 05 කගේ සේවා කාලය සේවා අවශ්‍යතාවය මත 2022.07.01 දින සිට 2022.12.31 දක්වා ඉදිරියට මාස 06 ක් සඳහා දීර්ඝ කර ඔවුන් වෙත සභා අරමුදලින් දෛනික පදනම මත දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටු මිල ගණන් යටතේ වැටුප් ගෙවීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

08. රට තුළ පවතින අයහපත් ආර්ථික තත්ත්වය හා අනෙකුත් අර්බුදකාරී වතාවරණය හේතුවෙන් තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු සියළු කඩ කාමරවලින් අය කරනු ලබන මාසික කඩ කුලී මුදල් ගෙවීම පැහැර හැරීමේදී අය කරනු ලබන 10% ක දඩ මුදල මෙම වතාවරණය යථා තත්ත්වයට පත් වන තෙක් අය නොකර එම කඩ බදු හිමියන් වෙත සහන ලබා දීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, වයි.කේ. වසන්ත ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ) කාරක සභාවල වාර්තා සළකා බැලීම -**

- 2022.06.03 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව සළකා බැලීම.

  සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

- 2022.06.03 වන දින පැවති නිවාස හා ප්‍රජා කාරක සභා වාර්තාව සළකා බැලීම.

  සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

- 2022.06.03 වන දින පැවති කාර්මික සේවා කාරක සභා වාර්තාව සළකා බැලීම.

  සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

- 2022.06.03 වන දින පැවති පරිසර හා පොදු පහසුකම් කාරක සභා වාර්තාව සළකා බැලීම.

  සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

## (ඉ) වෙනත් කරුණු

❖ <u>ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතාගේ අදහස් දැක්වීම</u>

2022.06.08 වන දින රාත්‍රී 7.10 ට පමණ අප සභාවේ මුරකරුවන් දෙදෙනෙකු විසින් සිදු කරන ලද ඩීසල් වංචාව පිළිබඳව මා විසින් සියලුම දෙනා දැනුවත් කරන ලදී. මීට පෙර ආදාහනාගාරයේ වාහන නතර කර තිබෙන අවස්ථාවක, වාහනවල ඉන්ධන අඩු බවක් සිදු වන බව රියදුරන් විසින් ප්‍රකාශ කළ පසුව, නැවත වාහන සියල්ල ප්‍රධාන කාර්යාලයේ නවතා තැබීමට කටයුතු කරන ලදී. ඒ අතරට මුරකරුවන්ද වෙනස් කර සේවයේ යෙදවීමට කටයුතු කරන ලදී. 2022.06.08 වන දින කාර්යාලය තුළ මුරකරුවන් දෙදෙනෙක් වාහනලින් ඩීසල් ලබා ගන්නා බව කාර්යාලයේ මුර සේවය සඳහා යොදවා සිටින මුරකරු විසින් තමා වෙත ලබා දුන් දුරකතන ඇමතුම අනුව, තිස්සමහාරාම පොලිස් ස්ථානය වෙත දන්වා, එක් මුරකරුවෙකු අත්අඩංගුවට ගැනීමට කටයුතු කළ අතර, අනෙක් මුරකරු ඊට පසු දින අත්අඩංගුවට ගන්නා ලද බවත්, මීට අදාළ විමර්ශන කටයුතු සිදු කරන බවත් සියලුම ගරු සභිකයින්ගේ දැනුවත් වීම සඳහා ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

ඉන් අනතුරුව මේ පිළිබඳ දැන ගත් මාධ්‍යවේදියෙකු විසින් පැමිණ ඊට අදාළ තොරතුරු ලබා ගැනීමට කටයුතු කළද, එකී නිවැරදි තොරතුරු උපායමාර්ගික ලෙස අපහාස සහගතව සාවද්‍ය ලෙස පල කිරීමට කටයුතු කර ඇත. සභාවෙන් වංචනික ලෙස ලබා ගන්නා ඩීසල් සභාවේම මන්ත්‍රීවරුන්ට ලබා දෙනවා යනුවෙන් සඳහන් පුවත ඉතාමත් නින්දිත වැරදි සහගත සාවද්‍ය පුවතක් ලෙස විකාශය කිරීම ඉතාමත් වැරදි ක්‍රියාවකි. මෙම පුවත සියලුම ගරු සභිකවරුන්ට අගෞරවයක් ගෙන දෙන පුවතකි. මෙම සිදුවීම විකාශය වු හිරු මාධ්‍ය ජාලයට වහාම මෙම පුවත නිවැරදි කර විකාශය කරන ලෙසට අප දැන්වීම් කළද, මෙතෙක් එය නිවැරදි කිරීමට එම ආයතනය කටයුතු කර නොමැති වුවත්, ලංකාදීප පුවත්පත එම පුවත නිවැරදි කිරීමට කටයුතු කර ඇති බව සඳහන් කරන ලදී. ඩීසල් වංචාවේ දී අප සභාවේ ගරු සභිකවරුන් පිළිබඳව හිරු, ස්වර්ණවාහිණී මාධ්‍ය ජාලා විසින් සාවද්‍ය පුවත් විකාශනය කර තිබීම හේතුවෙන් නීතිඥවරයෙකුගේ උපදෙස් ලබා ගෙන, ඊට අදාළ නීතිය ක්‍රියාත්මක කළ යුතු බවත් දන්වා සිටින ලදී.

සභාපති ලෙස මා වගකීමකින් යුතුව ගරු සභිකවරුන්ගේ ද ගෞරවය රැකෙන පරිදි මේ දක්වා කටයුතු කර ඇත. එසේ කටයුතු කර තිබියදීත්, හිරු මාධ්‍ය ජාලය, පත්තරේ විස්තර තුළින් ගරු සභිකවරුන්ගේ ගෞරවය නැති වන ආකාරයේ පුවත් විකාශය කිරීම ඉතාමත් වැරදි ක්‍රියාවක් වන බැවින්, මෙම පුවත හිරු මාධ්‍ය ජාලය හරහා අනිවාරයෙන්ම නිවැරදි කිරීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා</u>

සභාවේ ඩීසල් වංචාව සම්බන්ධයෙන් මාධ්‍යජාලයට තොරතුරු ලබා ගත් මාධ්‍යවේදියා දිගින් දිගටම තිස්සමහාරාමය සම්බන්ධයෙන් වැරදි පුවත් පල කරනු ලබයි. නිවැරදි පුවත් වැරදි ආකාරයෙන් පල කිරීමට කටයුතු කිරීම ඉතාමත් වැරදි ක්‍රියාවකි. මොහු මාධ්‍ය වේදී තනතුරට නොගැලපෙන පුද්ගලයෙක් වන බැවින්, මොහුගේ තනතුර අහෝසි කිරීම සුදුසු වන බව දන්වා සිටින ලදී. එසේම අප සභාවට පෙනී සිටින තිස්සමහාරාමයේ මාධ්‍යවේදීන් දෙපල කිසි දිනක කිසිදු පුවතක් වැරදි ආකාරයෙන් ප්‍රචාරය කර නොමැති බවත් දන්වා සිටින ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා</u>

මෙම මාධ්‍ය වේදියා දිගින් දිගටම වැරදි පුවත් පල කරනු ලබයි. නිවැරදි පුවතක් වැරදි ආකාරයෙන් ප්‍රචාරය කිරීම විශාල වරදකි. එම් නිසා මොහු මෙලෙස වැරදි පුවත් ප්‍රචාරය කිරීම වහාම නවතා දැමිය යුතු බව ප්‍රකාශ කර සිටින ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා සභික, ජී.එච්.ජී. නීටා මහත්මියගේ අදහස් දැක්වීම**

මහින්දාගමනය සිදු වූ පොසොන් මාසයේ ද මුව දඩයමේ ගිය දේවානම්පියතිස්ස රජතුමා එම පවින් වළකා ගැනීමට මිහිඳු මහරහතන් වහන්සේට හැකි විය. එසේම බෞද්ධයන් විසින් කළ යුතු නොකළ යුතු, පිං, පව් ආදිය බෞද්ධ ආගමෙන් වටහා දී එයින් මුදවා ගැනීමට කටයුතු කරනු ලබයි. එසේම 05.09 වන දින සිදු වූ ත්‍රස්ථ ප්‍රහාරයට සම්බන්ධ සියලුම දෙනාටත් බෞද්ධ ආගම අනුව එල විපාක නිසැකවම ලැබෙනු ඇත.

වසර ගණනාවකින් පසුව, නැවතත් තිස්සමහාරාම පොසොන් පෙරහැර පැවැත්වීමට කටයුතු කිරීම සඳහා මැදිහත් වූ තිස්සමහාරාම රජමහා විහාරස්ථානයේ නායක ස්වාමීන් වහන්සේට, ගරු සභාපතිතුමාට, ප්‍රාදේශීය ලේකම් තුමියට සහ වෙළඳ සංගමයට ස්තුතිය පුද කරන ලදී. ගරු සභාපතිතුමා පොසොන් පෙරහැර පැවැත්වීම සඳහා නායකත්වය සහ සහාය ලබා දීමට කටයුතු කළ බව විහාරස්ථානයේ නායක ස්වාමීන් වහන්සේ විසින් දන්වා සිටින ලදී. එසේම ගරු චමල් රාජපක්ෂ මැතිතුමාද විහාරස්ථානයට පොහොය දිනට පෙර දින පැමිණ පෙරහැර කටයුතු සම්බන්ධයෙන් සොයා බැලීම් කළ බව නායක ස්වාමීන් වහන්සේ විසින් මා වෙත දන්වා සිටින ලදී. වසර ගණනාවකින් තිස්සමහාරාම පොසොන් මංගල්‍ය පැවැත්වීමට හැකි වීම සතුටට කරුණකි. ඒ සඳහා අප ආයතනයේ ද සහාය ලබා දීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා ඇතුළු ගරු සභිකයින්ටත්, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටත් ස්තුතිය පුද කරන ලදී.

ගරු සභාපතිතුමා සහ මා එකම ගමක සිට පක්ෂ දෙකකින් දේශපාලනය කළද, අප දෙදෙනා සහෝදරත්වයෙන් යුතුව කටයුතු කරනු ලබයි. දේශපාලන මත වාද කුමක් තිබුණත් මනුස්සකමින් කටයුතු කරන දෙපලක් ලෙස අප දෙපල හැඳින්විය හැකිය. පසුගිය 05.09 වන දින සිදු වූ ත්‍රස්ථ ප්‍රහාර හමුවේ ගමේ ඇතැම් පුද්ගලයින් ගරු සභාපතිතුමා එම සිදුවීම් නිසා දේශපාලනයෙන් සමු ගනී යනුවෙන් යම් යම් ප්‍රකාශ ප්‍රචාරය කරනු ලබයි. මෙකී සිදුවීම් වලින් කඩා වැට්ටවීමට බොහෝ පිරිස් බලා ගෙන සිටිනු ඇත. එම නිසා සිදු වූ සෑම සිදුවීමකින්ම පන්නරය ගෙන, ශක්තිමත් වී ඉදිරියටත් ජනතාව වෙනුවෙන් කටයුතු කරන ලෙසට ගරු සභාපතුතමාගෙන් ඉල්ලා සිටින ලදී.

එසේම 05.09 වන දින සිදු වූ ත්‍රස්ථ ප්‍රහාරයෙන් ගරු සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතාගේ නිවස ගිණි බත් කළ පුවත කුඩා දරුවන්ගේ සිත්වල ඉතාමත් සන්වේදීව පවතින බව තමාගේ දියණිය ඇතුළු දරුවන් ප්‍රකාශ කළ වදන් වලින් තමා වෙත තේරුම් ගැනීමට හැකි වූ බව සඳහන් කරන ලදී. එසේම ගරු සභික, චතුමිණි දිල්ෂාණි විජේනායක මෙනවියගේ නිවස සඳහා සිදු වූ හානිය පිළිබඳවත් බොහෝ පිරිස් ඉතාමත් දුක්ඛිතව කතා බහ කරන බව තමා දන්නා කරුණකි.

පසුගිය දින සිදු වූ සියලුම සිදුවීම් හමුවේ කඩා නොවැටී, එකී සිදුවීම් වලින් පන්නරය ගෙන, ගරු සභාපතිතුමා සහ අනෙකුත් සහෝදර සභිකවරුන් දෙදෙනාත් ශක්තිමත් වී දේශපාලන කටයුතු ඉදිරියටම කර ගෙන යාමට කටයුතු කළ යුතුය.

පසුගිය දිනක කාන්තා ගරු සභිකවරුන් සඳහා හම්බන්තොට ජෙට්වින් හෝටලයේ කැෆේ සංවිධානය මගින් පැවැත්වීමට කටයුතු කළ සමාජ මාධ්‍යජාලය පිලිබඳ වැඩමුළුවට මා හට සහභාගී වීමට හැකි වුයේ ගරු සභාපතිතුමාගේ මැදිහත් වීම මත, මා හට ඒ සඳහා අවස්ථාව ලබා දුන් නිසාවෙන්ය. එහිදී සාමාජ මාධ්‍යජාලය පිළිබඳ බොහෝ තොරතුරු ලබා ගැනීමට හැකි වූ බවත්, එම අවස්ථාව මා හට ලබා දීම වෙනුවෙන් ගරු සභාපතිතුමාට ස්තුතිය පුද කරන බවත් ප්‍රකාශ කරන ලදී.

රට තුළ කෙතරම් ආර්ථික අගහිඟකම් තිබුණද, මෙවර පොසොන් පොහොයට දන්සල් රැසක් පැවැත්වීමට ජනතාව කටයුතු කරන ලදී. මෙසේ දුෂ්කර කාලයක් තුළ වැඳ පුදා ගැනීම සඳහා පැමිණෙන ජනතාවගේ විඩාව, කුසගින්න නිවීමට සඳහා දන්සල් ලබා දුන් සියලුම ජනතාවට කෘතවේදී ස්තුතිය පුද කර සිටින ලදී. එසේම මෙවර පන්නෙගමුව දන්සල පැවැත්වීමට නොහැකි

වීමත් කණගාටුවට කරුණකි. ගරු සභාපතිතුමාගේ මැදිහත්වීම මත මෙතෙක් සිදු කරන්නාවූ පන්නෙගමුව ෆ්‍රයිඩ් රයිස් දන්සල මෙවර පැවැත්වීමට නොහැකි වුවත්, ඉදිරි වර්ෂයේ සිට සාර්ථකව සිදු කිරීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

රටේ ජනතාව දැඩි ආර්ථික දුෂ්කරතාවයකින් සිටින කාලයක සහ රට කඩා වැටීමකට පත්ව සිටින කාලයක ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාට සහ ගරු මන්ත්‍රී මණ්ඩලයට එක්ව රට පත්ව ඇති මෙම අර්බුදකාරී තත්ත්වයෙන් ගොඩ ගැනීමටත්, ජනතාව පත්ව ඇති අසරණ තත්ත්වයෙන් මුදවා ගැනීමටත් එම සියලුම දෙනාට ශක්තිය ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කරන ලදී.

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, චමින්ද ඩයස් වන්නිගේ මහතාගේ අදහස් දැක්වීම</u>**

අප සහෝදර ගරු සභිකයින් දෙදෙනෙක් වන ගරු සභික, එම්.එල්.එම්. හනීෆා මහතා සහ ඩබ්.කේ.කේ. ශාන්තිලතා මහත්මිය අප පක්ෂයෙන් නෙරපා හැරීමට කටයුතු කර ඇති බව එක්සත් ජාතික පක්ෂය මගින් දන්වා තිබුණද, එය සිදු වීමට කුමන කරුණු බලපා ඇත්ද යන්න අප මේ වන තෙක් නොදන්නා කරුණකි. කරුණු කෙසේ වුවත් එම ගරු සභිකයින් දෙදෙනා අප සමඟ එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් වසර 04 ක පමණ කාලයක් සහෝදරයින් සේ කටයුතු කර ඇති බැවින්, ඔවුන් දෙදෙනා අප පක්ෂයෙන් නෙරපා හැරීම පිළිබඳව කණගාටු වන බව ප්‍රකාශ කරන ලදී.

ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා රට දැඩි දුෂ්කරතාවයකට පත්ව ඇති කාලයක ගරු අග්‍රාමාත්‍ය ධූරය භාර ගෙන කටයුතු කිරීමේ දී, එතුමා ගෙන යන වැඩපිළිවෙළවල් ක්‍රියාත්මක කිරීමට ඉඩ නොදී රටේ විවිධ අංශ වෙතින් බාධා ඇති කිරීම වැරදි ක්‍රියාවකි. ජනතා විමුක්ති පෙරමුණ පක්ෂය යනු කිසිදු නායකයෙකුට රට භාර ගෙන කටයුතු කිරීමට ඉඩ නොදෙන පක්ෂයකි. රටේ නායකයින් කොපමණ හොඳ වුවත් ඒ වටේ සිටින මිනිසුන් නිසා එම නායකයින්ගේ ද යහපත්කම් නැති වී යනු ඇත. රට පාලනය කරන නායකයින් සිදු කරන ක්‍රියාවන් සඳහා බාධා ඇති නොකර, අඩුපාඩු සෙවීමට කටයුතු නොකර, සියලුම දෙනා එක්ව රට ගොඩ නැගීමට කටයුතු කළ යුතු බව දන්වා සිටින ලදී.

රට තුළ සහල් ඇතුලු අනෙකුත් සියලුම ද්‍රව්‍ය විවිධ විවිධ මිල ගණන් යටතේ ඉතාමත් අධික මිලකට අලෙවි කරනු ලබයි. එම නිසා පාරිභෝගික අධිකාරිය මේ සම්බන්ධයෙන් දැනුවත් කර, මෙලෙස අධික මිලකට අළෙවි කරනු ලබන වෙළඳසැල් පිළිබඳව සොයා බලන ලෙසට ඉල්ලීම් කිරීම සුදුසු බවට දන්වා සිටින ලදී.

පසුගිය 2022.05.09 වන දින සිදු වූ අරගලයේ දී ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ දෙමාපියන්ගේ පිළිරූ කඩා බිඳ දැමූ, ගරු සභාපතිතුමා, ගරු සභික ඩබ්.කේ. ටෂිත සමිල මහතා, චතුමිණි දිල්ෂාණි විජේනායක මෙනවියගේ නිවෙස් ගිණිබත් කර කුඩු කර දමා සිදු කරනන්නාවූ විනාශකාරී සිදුවීමට අදටත් තමා කණගටු වන බවත්, එකී සිදුවීම් වලට සම්බන්ධ සියලුම දෙනාට සියලුම දෙවි දේවතාවන්ගේ සාපය ලැබේවායි ප්‍රාර්ථනා කරන ලදී.

එසේම මෙම විනාශකාරී සිදුවීම් හමුවේ ගරු සභාපතිතුමා, ගරු සභික ඩබ්.කේ. ටෂිත සමිල මහතා, චතුමිණි දිල්ෂාණි විජේනායක මෙනවියටත් නොවැටී, ඉදිරියටත් ශක්තිමත් වී කටයුතු කිරීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතාගේ අදහස් දැක්වීම</u>**

උද්ධකන්දර බල ප්‍රදේශයේ අක්කර 500 ක භූමි ප්‍රමාණයක් පොලිස් විශේෂ කාර්ය බලකායට වගා කිරීම සඳහා ලබා දීමට සැලසුම් කර ඇති බව ගම්වල යන ප්‍රචාරය නිසා ගම්වාසීන් ඉතාමත් කෝපයෙන් යුතුව සිටී. මෙම ව්‍යාපෘතිය සඳහා ලබා දීමට අක්කර 500 ක භූමි ප්‍රමාණයක් අප ප්‍රදේශයේ නොමැත. අප ප්‍රදේශයේ තිබෙන ඉඩම් පාරම්පරිකව ගොවිතැන් කරන ගොවි ජනතාවගේ ඉඩම් වන බැවින්, එම ඉඩම් අහිමි වේ යන මතය මත ගොවි ජනතාව ඉතාමතේ දේශයෙන් යුතුව මේ

දිනවල කටයුතු කරයි. එම නිසා වගා ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා පොලිස් විශේෂ කාර්ය බලකායට ඉඩම් ලබා දීමේදී අප ප්‍රදේශයේ පාරම්පරිකව ගොවිතැන් කරන ගොවි ජනතාවගේ ඉඩම් අහිමි වීමට ඉඩ නොදෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

මෙකී අක්කර 500 ලබා දීමේදී, ගම්මානයට යාබද ඉඩම්වලින් ලබා නොදී, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් භූමි භාගයන් තුළින් ලබා දීමට කටයුතු කිරීම වඩාත් සුදුසු වනු ඇත.

අප රටට ගවයින් විදෙස් රටවලින් ගෙන්වීමට කටයුතු කරනු ලබයි. පිටරටින් ගවයින් ගෙන්වීමට කටයුතු කළද, අප ප්‍රදේශයේ ගවයින් හට ආහාර ගැනීමට තණ බිමක් මේ වන තෙක් නම් කර දීමට කටයුතු කර නොමැත. ගවයින් යනු රටට සම්පතකි. අවුරුදු 30-40 ක තිස්සේ ගවයින් සඳහා තණ බිම් ලබා දෙන බවට ගව හිමියන් මුලා කරනු ලබයි. ඉදිරියට හෝ නව බලාපොරොත්තුවක් ලබා දීමට මෙම ගව හිමියන් සඳහා තණ බිමක් ලබා ගැනීමට දේශපාලන නායකයින් සමඟ සාකච්ඡා කර විසඳුමක් ලබා දීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසට ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින ලදී.

පසුගිය විනාශකිරීම්වලට සම්බන්ධ පිරිස් අත්අඩංගුවට ගත් පසුව, ඔවුන් නිදහස් කරන ලෙසට ගුරුවරුවන් විසින් මේ දිනවල ඉල්ලීම් කරන පුවත් සමාජ මාධ්‍යජාලයේ දැක ගැනීමට ලැබෙනු ඇත. මෙවැනි විනාශකාරී ක්‍රියාවන්ට සම්බන්ධ පිරිස් සඳහා ගුරුවරුන් ද පෙනී සිට කටයුතු කිරීමෙන් ගුරුවරුන් කවුරුන්ද යන්නත් සිතා ගත හැකි වන බවත්, එම ගුරුවරුන් සම්බන්ධයෙන් ද සොයා බැලිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී. එසේම අදටත් මෙම විනාශකාරී ක්‍රියාවන්ට සම්බන්ධ පිරිස් සඳහා නීතිය ක්‍රියාත්මක වීම නිසි පරිදි නොවන බැවින්, ඒ සම්බන්ධයෙන්ද දැඩි අවධානයෙන් යුතුව කටයුතු කළ යුතු බව ප්‍රකාශ කරන ලදී.

මෙකී විනාශකාරී සිදුවීම් සඳහා සම්බන්ධව සිටින අප සභාව නියෝජනය කරන ගරු සභික, එල්.එච්. කුමුදු සුජීව මහතා මේ වන විට සැංගී සිට අද දින නිවාඩු ලිපියක් ඉදිරිපත් කර තිබුණද, ඔහු සඳහා නිවාඩු අනුමත කිරීමක් සිදු කිරීම අද කළ නොහැකි වන බව සඳහන් කර සිටින ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>උද්ධකන්දර ප්‍රදේශයේ වගා කිරීම සඳහා ත්‍රිවිධ හමුදාවට ලබා දෙන අක්කර 500 ව්‍යාපෘතියේ දී, සත්‍ය වශයෙන්ම එම ප්‍රදේශයේ පාරම්පරිකව වගාවන් කරන ගොවි ජනතාව හැර, එම ප්‍රදේශයේ අනවසරයෙන් අක්කර 10-15 අත්පත් කර ගෙන ඇති සියලුම දෙනාගේ ඉඩම්වල, ඉඩම් අක්කර කොපමන පවතින්නේද යන්න සමීක්ෂණයක් සිදු කරන ලෙසට දිස්ත්‍රික් ලේකම්තුමන් වෙත දන්වා යැවීමට තීරණය විය.</u>

<u>මෙම අක්කර 500 වගා කටයුතු සඳහා ලබා දීමේදී එම ප්‍රදේශයේ පාරම්පරිකව ගොවිතැන් කරන ගොවි ජනතාවගේ ඉඩම් අහිමි වීමට ගියහොත්, ඒ සඳහා අපට පෙනී සිට කතා කළ හැකි වුවත්, එම ප්‍රදේශයේ ජාවාරම් ලෙස ඉඩම් අක්කර බොහෝ ප්‍රමාණයක් වංචනික ලෙස ලබා ගෙන ඇති පුද්ගලයින්ගේ ඉඩම් සඳහා අප හට කිසි දිනක පෙනී සිට කතා කළ නොහැකි බව ප්‍රකාශ කරන ලදී.</u>

<u>ගවයින් සඳහා තණ බිම් ලබා දීම සම්බන්ධ යෝජනාව මා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු වාර කිහිපයකටම ඉදිරිපත් කළද, මේ දක්වා එම කිසිදු යෝජනාවකට ක්‍රියාත්මක වීමක් නිලධාරීන් විසින් සිදු කර නොමැත. මේ සම්බන්ධව අදාළ කටයුතු සිදු කළ යුත්තේ රාජ්‍ය නිලධාරීන් විසින්ය. එම නිසා මෙකී විස්තරය ඇතුළත් කර, නැවතත් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වෙත යෝජනාවක් ඉදිරිපත් කිරීමට තීරණය විය.</u>

❖ <u>ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතාගේ අදහස් දැක්වීම</u>

202205.09 වන සිදු වූ ප්‍රචණ්ඩ ක්‍රියාවට සම්බන්ධ වී අත්අඩංගුවට ගත් පිරිස් සඳහා සහ ඊට සම්බන්ධ අනෙක් අය අත්අඩංගුවට ගැනීම සඳහාත් නීතිය නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහාත් පොලිස් ස්ථානාධිපතිට ඕනෑකමක් තිබුණත්, ඊට පහල නිලධාරීන් මේ සඳහා කිසිදු ක්‍රියාත්මකවීමක් සිදු නොකරයි. එම නිසා මෙම සිදුවීමට සම්බන්ධ සියලුම දෙනා කඩිනමින් අත්අඩංගුවට ගත යුතුය. එසේ සිදු නොවුනහොත් මේ සඳහා සම්බන්ධ බොහෝ පිරිසක් විදෙස් ගත වීමට සිටින බැවින්, ඔවුන්ව අත්අඩංගුවට ගැනීමට නොහැකි වනු ඇත. එම නිසා මේ සම්බන්ධයෙන් දැඩි අවධානය යොමු කර, කඩිනමින් අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසට ගරු සභාපතිතුමාට දන්වා සිටින ලදී. එසේ මේ සඳහා සැප සහිතව පැමිණිලි කර ඇති නම් හෝ ගුවන් තොටුපලට ලබා දීම විදෙස් ගමන් තහනම් කිරීමක් සිදු කළ හැකි නම් එය වඩාත් සුදුසු වන බව ප්‍රකාශ කර සිටින ලදී.

මෙම සිදුවීමට සම්බන්ධ වී මේ වන විට සැඟවී සිටින පිරිස්, ඔවුන්ගේ නම් සැක සහිත නාම ලේඛනයෙන් ඉවත් කර ගැනීමට විවිධ වැඩපිළිවෙලවල් යොදනු ලබයි. එම නිසා මෙකී කරුණ සම්බන්ධයෙන්ද අවධානය යොමු කරන ලෙසට දන්වා සිටින ලදී. එසේම මෙම සිදුවීමට සම්බන්ධ සියලුම දෙනාට ඉහලම තැනට ගොස් හෝ ලබා දිය යුතු දඬුවම ලබා දිය යුතු බවත් දන්වා සිටින ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>2022.05.09 වන දින සිදු වූ ප්‍රචණ්ඩකාරී ක්‍රියාවට සම්බන්ධ සැක සහිත පිරිස් විදෙස් ගත වීමට බලාපොරොත්තුවෙන් සිටින බැවින්, වහාම එම පිරිස් පොලිස් අත්අඩංගුවට ගන්නා ලෙසට පොලිස් ස්ථානය වෙත කඩිනමින් දැන්විය යුතුය.</u>

❖ <u>ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.පී. ධම්මික මහතාගේ අදහස් දැක්වීම</u>

පසුගිය දිනක සභාවේ මුරකරුවන් 02 ක් විසින් සොරකම් කරන ලද ඉන්ධන සභාවේම ගරු සභිකයින් වෙත අලෙවි කරන බවට විකාශය වූ පුවත, අප සියලුම ගරු සභිකයින් වෙත එල්ල වූ කරුණක් වුවත්, එකී පුවත පළ කරන ලද මාධ්‍යවේදියා විසින් වැරදි ආකාරයෙන් එම පුවත පළ කර ඇති බැවින්, එය නිවැරදි කරන ලෙසට හිරු නාලිකාවට ලිපියක් මගින් දන්වා යවා ඇති බවත් අද දින ගරු සභාපතිතුමා අප සියලුම දෙනාගේ දැන ගැනීම සඳහා ප්‍රකාශ කිරීම හොඳ දෙයක් බවත් දන්වා සිටින ලදී.

ඇතැම් මාධ්‍යවේදීන් යම් යම් පුවත් වැරදි ආකාරයෙන් එල කර තම නම රැක ගැනීමට කටයුතු කරන අවස්ථාවන්ද තිබෙනු ඇත. මෙම පුවත පල කරන ලද මාධ්‍යවේදියා ද එසේ කටයුතු කලා යැයි සිතිය හැකිය.

පසුගිය දිනක මා මෙම සභාවේම දක්වන ලද අදහස් දැක්වීමක්, පුවත්පතක වැරදි ආකාරයෙන් පල වී තිබීම කණගාටුවට කරුණකි. එම අදහස් දැක්වීමෙන් මා පැහැදිලිවම ප්‍රකාශ කරන ලද්දේ රට පාලනය කළ සියලුම දේශපාලන නායකයින් සෑම කෙනෙක් යම් යම් අවස්ථාවන්වල අප රටේ දේවල් විදෙස් රටට බදු දීමට කටයුතු කළ බවයි. එසේ මා ප්‍රකාශ කළ ඇති පුවත පල වී ඇත්තේ වැරදි ආකාරයකින් බව නැවතත් කණගාටුවෙන් දන්වා සිටිමි.

උද්ධකන්දර ප්‍රදේශයේ අක්කර 500 වගාවන් සඳහා ලබා දීමේදී, මිල්ලත්ත හන්දියේ සිට සිතුල්පව්ව පාරේ කෙලවර දක්වා වූ භූමි ප්‍රමාණය මේ සඳහා නම් කර ඇත. මෙම භූමි ප්‍රමාණය අතර පාරම්පරිකව ගොවිතැන් කටයුතු කරන ගොවි ජනතාවගේ ඉඩම් ප්‍රමාණයන් තිබෙනවා සේම, අක්කර 10-15 වංචනික ලෙස මිලදී ගත් ඉඩම්ද මේ අතර පවතිනු ඇත. එම නිසා මෙම වගා ව්‍යාපෘතිය සිදු කිරීමේදී ගොවි ජනතාව වගා කරන භූමිය හැර වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම්

මේ සඳහා ලබා ගෙන, පාරම්පරික ගොවි ජනතාවගේ ඉඩම් අහිමි වීමට ඉඩ නොදිය යුතු බව ප්‍රකාශ කරන ලදී.

පොලිස් විශේෂ කාර්ය බලකායට වගා කිරීම සඳහා ගම්මානයට ආසන්න භූමි ප්‍රමාණයක් ඉල්ලීම් කිරීම නිසා, ගම්වාසීන් දැඩි කෝපයෙන් යුතුව කටයුතු කරයි. එය එසේ සිදු වුවහොත් සිදු වන්නේ දැඩි අසාධාරණයකි. එම නිසා මේ සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම්තුමිය සමඟ සාකච්ඡා කළ යුතු බව ප්‍රකාශ කරන ලදී.

අද දිනත් මා 05.09 වන දින සිදු වූ ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන්වලට කණගාටුව පල කරන ලදී. එසේම මේ සඳහා සම්බන්ධ සියලුම දෙනාට අනිවාරයෙන් නීතිය ක්‍රියාත්මක කළ යුතුය.

❖ **අදහස් දැක්වීම – ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා**

අප මහා සභාව සඳහා පැමිණෙන මාධ්‍යවේදී රංජිත් ඩයමන් මහතා සහ ප්‍රේමදාස මහතා කිසි දිනක කිසිදු පුවතක් වැරදි ආකාරයෙන් පල කර නොමැත. යම් පුවතක් පල කරන්නේ නම්, එය ඉතාමත් වටිනාකමින් වගකීමකින් යුතුව තිස්සමහාරාමයට ගෞරවයක් ගෙන දෙන ආකාරයෙන් පල කරන බවත්, එය අගය කරන බවත් ප්‍රකාශ සිටින ලදී.

ගරු චමල් රාජපක්ෂ මැතිතුමා විසින් උද්ධකන්දර අක්කර 500 ක වගා ව්‍යාපෘතිය සිදු කිරීම සැලසුම් කරන ලද්දේ, එමගින්, වන අලින් ගම්මානයට පැමිණීම වළකා ගැනීමටත්, වන සතුන් දඩයම් කිරීම වළක්වා ගැනීමටත් යන කරුණු පදනම් කර ගනිමින් මෙම වගා ව්‍යාපෘතිය කැලෑ බඳට ආසන්නව සිදු කිරීම සඳහා ඊට ආසන්න ඉඩම් තෝරා ගැනීමට තීරණය කර තිබුණි. එසේම අතිගරු ජනාධිපතිතුමා විසින් රටේ ආහාර නිෂ්පාදනය වැඩි කර ගැනීම සඳහා වගා ව්‍යාපෘති ත්‍රිවිධ හමුදාව සම්බන්ධ කර ගනිමින් සිදු කිරීමට තීරණය කර ඇති බවත් සඳහන් කරන ලදී.

උද්ධක්නදර අක්කර 500 වගා ව්‍යාපෘතිය සම්බන්ධයෙන් මතු වූ ඇතැම් ගැටළු පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සාකච්ඡාවක් ලබා ගැනීම සුදුසු වන බවත්, ඒ සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති, ගරු වෛද්‍ය උපුල් ගලප්පත්ති මැතිතුමා, දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම්, අදාළ කොට්ඨාස භාර ගරු සභිකයින් සහ අදාළ කොට්ඨාසයෙන් ගොවි සංවිධාන නිලධාරීන් දෙදෙනෙක් සම්බන්ධ කර ගැනීමට කටයුතු කරන ලෙසටත් ගරු සභිකයින් වෙත දන්වා සිටින ලදී. එසේම මෙම රැස්වීම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ලබා ගැනීමට ඉල්ලීමක් කර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලිපියක් යොමු කිරීමටත් තීරණය විය. එසේම එකී රැස්වීම පැවැත්වෙන දිනට මේ සඳහා අවශ්‍ය කරන සියලු තොරතුරු රැගෙන ඒමට කටයුතු කරන ලෙසටත් අදාළ ගරු සභිකවරුන් වෙත දන්වා සිටින ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා සභික, හර්ෂ ජයවීර මහතාගේ අදහස් දැක්වීම**

සභාවේ සිදු වූ ඉන්ධන සොරකම සම්බන්ධයෙන් වූ පුවතේදී ගරු සභිකයින්ගේ ද නම් සම්බන්ධ වී තිබීම අපටද කණගාටු විය යුතු කරුණකි. අප මහජන නියෝජිතයින් සේ මීට පෙරත් කටයුතු කළද කිසි දිනක මෙලෙස වැරදි නාමයක් අපට හිමි වී නොමැත. ගරු සභිකයින්ගේද නම් ඇතුළත් කර එම මාධ්‍යවේදියා විසින් වැරදි පුවත් ප්‍රචාරය කිරීම පිළිබඳ කණගාටු වන බව ප්‍රකාශ කරන ලදී.

රටේ පවතින ආහාර හිඟයත් සමඟ, ඒ සඳහා විසඳුමක් ලෙසත්, තිස්සමහාරාමයෙන් රටට ආදර්ශයක් වන පරිදිත්, තිස්සමහාරාමයේ වසම් 44 හි සිටින නිලධාරීන් එකතු කර ගනිමින් ආදර්ශවත් ගෙවතු වගාවන් ආරම්භ කිරීමට කටයුතු කළ යුතු බවත්, එය සිදු කර ගෙන යාමේ දී සාර්ථකත්වය ලබා ගැනීම සඳහා පසු විපරමක්ද සිදු කළ යුතු බවත් දන්වා සිටින ලදී.

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ ද බොහෝ කලක් සේවය කර, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාවේ ලේකම් ධූරය දැරූ කේ.කේ.එස්.පී. මෙන්ඩිස් මහතා පසුගිය දිනක අප අතරින් සමු ගන්නා ලදී. එතුමන් රාජ්‍ය සේවයට ලොකු සේවයක් කළ උතුම් ගති පැවතුම් ඇති මිනිසෙක් ලෙස සඳහන් කළ යුතුය. එතුමාට නිවන් සුව සහ ශෝකය පල කරන ලදී.

තම කොට්ඨාසයේ මාර්ගයන් සකස් කිරීම සඳහා පස් ටිපර් කිහිපයක් ලබා දීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් ගරු සභාපතිතුමාට ස්තුතිය පුද කරන අතර, හැකි නම් තවත් අවස්ථාවක පස් ටිපර් කිහිපයක් ලබා දෙන ලෙසටත් ඉල්ලා සිටින ලදී.

❖ <u>ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතාගේ අදහස් දැක්වීම</u>

2022.05.09 වන දින සිදු වූ සිදුවීමට අදට මාස 01 ක් සහ දින 07 ක් ගෙවී ගොස් ඇත. ජනතා විමුක්ති පෙරමුණ පක්ෂය විසින් අප නිවාස ගිණිබත් කර සිදු කරන ලද ත්‍රස්ථ ක්‍රියාවට සම්බන්ද පිරිස් සඳහා මේ වන විට නීතිය ක්‍රියාත්මක වෙමින් පවතී. මෙකී සිදුවීම් සඳහා කමිටුවක් පත් කර අපගෙන් ද ඊට අදාළ තොරතුරු ලබා ගැනීමට කටයුතු කරන ලදී.

මෙම විනාශකාරී සිදුවීම අපගේ පෞද්ගලික හේතුවක් මත සිදු වූ දෙයක් නොවන අතර, අප සිදු කරන ලද දේශපාලනය නිසා සිදු වූ සිදුවීමක් ලෙස සඳහන් කළ යුතුය. අප දේශපාලනය සිදු කිරීමෙන් අද දින මෙලෙස දැඩි විනාශකාරී සිදුවීමක් සිදු වූ බැවින්, ඒ සඳහා ආණ්ඩුවෙන් අප හට යම් සහනයක් ඉදිරියේ දී ලැබෙනු ඇතැයි බලාපොරොත්තුවෙන් සිටී. තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තම ගිණිබත් වූ නිවාසය සඳහා සිදු වූ විනාශවීමට තක්සේරුවක් කළද, නිවසේ තිබූ බඩු බාහිරාදිය සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීමට ප්‍රාදේශීය ලේකම්තුමිය ඇතුළු නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත් කර තිබුණද, මේ වන තෙක් එම නිලධාරීන්ගේ පැමිණීමක් සිදු නොවූ බැවින්, මේ සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම්තුමා දැනුවත් කරන ලෙසට ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින ලදී.

එසේම 05.09 වන දින සිදු වූ සිදුවීමේදී ප්‍රචණ්ඩකාරී මිනිසුන් විසින් මාගේ නිවස ගිණි බත් කළ අවස්ථාවේ සිට මා ඇතුළු මාගේ පවුල් සියලු දෙනා පිලිබඳව සොයා බැලීම් කළ ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු සභිකයින් ඇතුළුව මාගේ හිතවතුන් සියලුම දෙනාට මාගේ ගෞරවණීය ස්තුතිය පුද කරන ලදී. එසේම අප අසරණ වී සිටි අවස්ථාවේ ආහාරපාන ලබා දෙමින් අප ගැන සොයා බැලූ ගම්වාසීන් සියලුම දෙනාටත් මාගේ ගෞරවණීය ස්තුතිය පුද කරන ලදී.

මා හට සේම, ගරු සභාපතිතුමාටත්, ගරු සභික චතුමිණි විජේනායක මෙනවියටත් මෙම සිදු වූ විනාශකාරී සිදුවීම කිසිදු දිනක වනේ වන හතුරෙකුටවත් සිදු නොවේවායි ප්‍රාර්ථනා කරන ලදී. එසේම මෙවැනි සිදුවීමක් කිසිදු කෙනෙකුට ඉදිරියේ දී හෝ සිදු නොවීමට අප සියලුම දෙනා වග බලා ගත යුතුය. එසේම මෙම සිදුවීම සඳහා සම්බන්ධ සියලු දෙනාට අනිවාරයෙන්ම නීතිය ක්‍රියාත්මක විය යුතුය. එසේ නොවුනහොත් මෙම සිදුවීමද සාමාන්‍ය දෙයක් වී දිගින් දිගටම මෙවැනි සිදුවීම් සිදුවීමට ඉඩ පවතිනු ඇත. මෙකී සිදුවීම් පූර්වාදර්ශයක් වීමට ඉඩ නොදී, මැති ඇමතිවරුන් සමඟ සාකච්ඡා කර, මෙම සිදුවීම්වලට සම්බන්ධ සියලුම දෙනාට උපරිමයෙන් දඩුවම් ලබා දීමට කටයුතු කළ යුතු බව ප්‍රකාශ කරන ලදී.

✓ 2022.06.16 වන අද දින මහා සභාව පැවැත්වෙන අතරතුර එනම්, පෙ.ව. 11.00 ට පමණ ජනතා විමුක්ති පෙරමුණ පක්ෂයේ ගරු සභික, ආර්. රජිත ප්‍රියදර්ශන මහතා කිසිදු දැනුම් දීමකින් තොරව සභාවෙන් නික්ම ගොස් ඇත. 2022.05.09 වන දින සිදු වූ ප්‍රචණ්ඩකාරී ක්‍රියාවට සැක සහිත පුද්ගලයෙකු ලෙස ඔහු, කිසිදු දැනුම් දීමකින් තොරව සභාවෙන් නික්ම ගොස් තිබීම අපටද වගකීමක් භාර ගැනීමට සිදුවන දෙයකි. මහා සභාවට පැමිණ කිසිදු දැනුම් දීමකින් තොරව ඔහු සභාවෙන් නික්ම

යාම පිළිබඳව, කිසිදු වගකීමක් අප හට භාර ගත නොහැකි බව අද දින ගරු මහා සභාවේ සියලුම දෙනා ඒකමතිකව තීරණය කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා සභික, කේ.එච්. ගාමිණී මහතාගේ අදහස් දැක්වීම**

රට මේ වන විට මුහුණ දී තිබෙන අවධානම් ආර්ථික අවස්ථාවේ, අප රටේ අනාගත දරුවන් රැක ගැනීම අපගේ සම්පූර්ණ වගකීමකි. සෑම දෙමාපියෙක්ම එම දරුවන්ට දුකක් නොදීමට කටයුතු කරයි. එය සාමාන්‍ය, පොහොසත් සේම දුගී දුප්පත් දෙමාපියෙක්ම සිදු කරන්නා වූ කරුණකි. රටේ ආර්ථික අර්බුදය හමුවේ ඉතාමත් ඡේදවාචක තත්ත්වයකට රට පත්ව ඇත. ඉදිරියේ ආහාර හිඟයක් ඇති වීමේ අවධානමක් දැඩිව පවතී. මෙකී සියලු අර්බුදකාරී තත්ත්වයන් සඳහා විසඳුම් ලබා ගැනීමට නම්, ශ්‍රී ලාංකිකයන් ලෙස අප සියලුම දෙනා එකට එක්වී කටයුතු කළ යුතු බව ප්‍රකාශ කරන ලදී.

රටේ ඇතිවන ආහාර හිඟයත් සමඟ දෙමාපියන් විසින් දරුවන් සඳහා ආහාර ලබා දීමට පවතින නොහැකියාව සම්බන්ධ පුවත් මාධ්‍ය තුළින් ඉතාමත් දුක්ඛිත ලෙස දැක ගැනීමට ලැබේ. මෙකී පුවත් ඉතාමත් සංවේදී පුවත්ය. රටේ පවතින ආර්ථික අර්බුදය හමුවේ දරුවන්ට ආහාර ලබා දීමට නොහැකිකමින් සිදු වූ ඛේදවාචක තත්ත්වයන්ද බොහොමයක් ඉතාමත් සංවේදීව දැක ගැනීමට හැකි විය. බුදුන්ගේ පාද ස්පර්ශය ලැබූ, බුදු දහම රකින උතුම් දේශයක මෙවැනි සිදුවීම් ඇසීමට දැකීමට සිදුවීම ඉතාමත් කම්පාවකි. මෙලෙස රට තුළ කුමන ප්‍රශ්න, බාධක පැමිණියත් එකී සියලු ප්‍රශ්න, ගැටළු, බාධක හමුවේ අපට ඉදිරියට කටයුතු කිරීමට සිදු වන බව කණගාටුවෙන් වුවද සඳහන් කළ යුතුය.

ඇතැම් දේශපාලන පක්ෂ දරුවන් ඉලක්ක කර ගනිමින් දේශපාලන අරමුණු ඉටු කර ගනු ලබයි. දරුවන්ට අධ්‍යාපන ලබා දීම වෙනුවට පටු දේශපාලනයට දරුවන් ඈඳ දමන පසුබිමක් අද වන විට නිර්මාණය කරමින් සිටී. මේ සම්බන්ධයෙන් අවධානයෙන් සිට රටේ අනාගත දරු පරපුර මෙවැනි දේ නිසා විනාශවීමට ඉඩ නොදිය යුතු බව සඳහන් කරන ලදී.

රටේ පවතින මෙම අර්බුදකාරී තත්ත්වයන් සමඟ රටේ දරු පරපුර මොට වීමට ඉඩ නොදී, නිවැරදි අධ්‍යාපනයක් ලබා දීමට අවශ්‍ය කටයුතු කිරීම සඳහා අප සියලුම දෙනා වගකීමෙන් යුතුව එක්ව කටයුතු කිරීම යහපත් කරුණක් වන බව ප්‍රකාශ කරන ලදී.

රට තුල ඇති වී ඇති ආර්ථික අර්බුදකාරී තත්ත්වය හමුවේ රටේ බොහෝ පිරිස් අප රට අතහැර දමා යන තත්ත්වයට පත්ව ඇත. අප රටේ ජනතාව රට අතහැර යාමට කටයුතු කිරීමත් ඉතාමත් කණගාටුදායක තත්ත්යකි.

රට තුළ ඇති වන ආහාර, ඖෂධ හිඟකම නිසා රටේ දරුවන් මිය යාමට ලක් වූ අවස්ථාවන් කිහිපයක් මාධ්‍ය තුළින් දැක ගැනීමට ලැබීමත් ඉතාමත් සංවේදී කරුණක් වනු ඇත. රට තුළ ඖෂධ හිඟවීමට බෙහෙවින් බලපා ඇත්තේ ඖෂධ මාපියාවන්ද රට තුළ පැවතීම බව කිව යුතුය. එසේම වගකිවයුත්තන් නිසිකලකට නිසි ක්‍රියාමාර්ග නොගැනීම මෙයට ප්‍රධාන කරුණ වේ.

රට තුළ ඇති තරමට සූර්යාලෝකය තිබියදී, එම සූර්ය තාපයෙන් විදුලිය ලබා ගැනීමට කටයුතු සිදු නොකරන්නේ රටේ ඉහල පුටුවල සිටින නිලධාරීන් විසින් සිදු කරන ලද විදුලිය මාපියාව නිසා බව සඳහන් කළ යුතුය. මෙලෙස කටයුතු කරන්නේ ඉන්ධන හිඟය සමඟ ඇති තරමට ඩොලර් ඔවුන්ට ලැබීම නිසාය. රටේ දේශපාලන අධිකාරියේ ප්‍රභල චරිත කිහිපයක් සහ ඉහල පුටුවල සිටින රාජ්‍ය නිලධාරීන් නිසා රටට අද වන විට මෙවැනි අර්බුදකාරී තත්ත්වයක් මතු වීමට බලපෑම් එල්ල වී ඇති බව කණගාටුවෙන් වුවද සඳහන් කළ යුතුය. එසේම ජනතාව වෙනුවෙන් සේවයක් කරන දේශපාලන නියෝජිතයින්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ ලබා ගන්නා සේම, මෙලස මාපියාවන් සිදු කරන රාජ්‍ය නිලධාරීන්ගේ ද වත්කම් බැරකම් ප්‍රකාශ ලබා ගැනීමට කටයුතු කළ යුතු බව දන්වා සිටින ලදී.

රට තුළ විවිධ විවිධ අර්බුදකාරී තත්ත්වයන් තිබුණද, සැබෑ අරගලකාරී තත්ත්වයක් තිබෙන්නේ ගෝල් ෆේස් හි නොව, රටේ ඉන්ධන පිරවුම්හල්, ගෑස් පෝලිම්, සතොස ආදී ස්ථානයන්වල බව කිව යුතුය.

පසුගිය 2022.05.09 වන දින සිදු වූ සිදුවීම් මාලාව ගත් කළ, රටේ දැඩි ඛේදවාචක තත්ත්වයක් මතු වූ බව කිව හැකිය. එමගින් ජීවිත, දේපළ බොහෝ විනාශ වීම් සිදු වන ලදී. මෙවැනි ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් ඉදිරියටත් සිදු නොවීමට අප සියලුම දෙනා එකතු වී වගබලා ගත යුතු බවත් දන්වා සිටින ලදී.

රටේ මෙවැනි අර්බුදකාරී තත්ත්වයකට පත්ව ඇති කාලයක් තුළ රට ඉදිරියට ගෙන යාමට හැකි හෝ නොහැකි අභියෝගය භාර ගැනීමට කටයුතු කළ ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාට කොන්දේසි විරහිතව පාට පක්ෂ භේදයකින් තොරව සහාය ලබා දිය යුතු බව ප්‍රකාශ කරන ලදී. එසේම අප නායකයා ලෙස එතුමන්ට අපේ ගෞරවය, ප්‍රණාමය හා ස්තුතිය පුද කරනු කැමැත්තෙමු.

ඈත අතීතයේ වගා සංග්‍රාමයත් සමඟ බොහෝ දෙනා වගාවන් සිදු කර තම එදිනෙදා ආහාර අවශ්‍යතාවයන් සපුරා ගන්නා ලදී. ටෙනිසන් එදිරිසූරිය මැතිතුමා විල්මැන්න, මාගම ඇලවල් කපා ගොවිතැන් සඳහා ජල පහසුකම් ලබා දීමෙන් ගොවි ජනතාව අදටත් තුන් වේලටම බත් කෑමට හැකි තත්ත්වයක් ඇති කර දෙන ලදී. එසේම අදටත් එතුමන්ට පිං සිදුවන්න වගාවන් කිරීම සඳහා එකී ඇල මාර්ග හරහා ජල පහසුකම් ලබා ගත හැකිය. රට තුළ පවතින ආහාර හිඟය අවම කිරීම සඳහා ඉදිරියේ රටවාසී සියලුම දෙනා බෝගා වගාවන් සිදු කිරීම ආරම්භ කරන්නේ නම්, ආහාර හිඟය යම්තාක් දුරට හෝ අඩු කර ගත හැකි වනු ඇත.

අතිගරු ජනාධිපතිතුමා යෝජනා කර ඇති පරිදි වගා සංග්‍රාමය ආරම්භ කිරීම සඳහා අප ආයතනයට අයත් ඉඩම්වල, පෙර පාසල්වල හැකි පමණින් වගා කිරීමටත්, ඉඩකඩ නොමැති ස්ථානයන්හි පෝච්චි තුළ හෝ වගා කිරීම ආරම්භ කිරීමත් සුදුසු වේ. එසේම මෙම වගා ව්‍යායාපෘතිය සිදු කිරීම සඳහා ප්‍රජා කමිටු ද දැනුවත් කරන ලෙසටත්, වගා ව්‍යාපෘති සඳහා රාජ්‍ය ආයතනවල සහාය ලබා ගන්නා ලෙසටත් ගරු සභාපතිතුමාට දන්වා සිටින ලදී. එසේම අවශ්‍ය බීජ වර්ග හා පැල වර්ග ප්‍රජාවට ලබා දීමද සිදු කළ යුතු යැයි ප්‍රකාශ කරන ලදී.

රට තුළ පවතින ආහාර හිඟයත් සමඟ අසරණ වී සිටින ජනතාවගේ මුදල් සූරාකන වංචනික ව්‍යාපාරිකයින් මෙම ප්‍රදේශයේ ද සිටින බැවින්, මෙවැනි ව්‍යාපාරික ස්ථාන සම්බන්ධයෙන් සොයා බලා, පාරිභෝගික අධිකාරිය විසින් නීතිය නිසියාකාරව ක්‍රියාත්මක වන්නේ නම්, එවැනි දේ ඉදිරියට සිදු නොවනු ඇත.

ගෑස් ලබා ගැනීමට නොහැකිව මෙම ප්‍රදේශයේ ජනතාවද දැඩි අසීරුතාවයකට පත්ව ඇත. එම නිසා අප ප්‍රදේශයටත් ගෑස් ලබා ගැනීමට වැඩපිළිවෙලක් සකස් කර ගත යුතු බව ප්‍රකාශ කරන ලදී.

රට තුළ පවතින ගෑස්, ඉන්ධනවල අඩුවක් පැවතියද, ගරු අග්‍රාමාත්‍යතුමා විසින් ලෝක ආධාර ලබා ගෙන ජනතාවට මෙකී අවශ්‍යතා හැකි පමණින් හෝ ලබා දීමට පියවර ගනු ලබන බැවින්, එතුමන්ට ඉදිරියේ දීත් මෙකී සියලු අවශ්‍යතාවයන් හිඟයකින් තොරව ජනතාවට ලබා දීමට ශක්තිය ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කරන ලදී.

උද්ධකන්දර ප්‍රදේශයෙන් වගා ව්‍යාපෘතිය සඳහා අක්කර 500 ක් ලබා දීමේ ව්‍යාපෘතියේ දී එම ප්‍රදේශයේ පාරම්පරිකව ගොවිතැන් කරන හේන් ගොවිතැනින්ම දිවි ගෙවන ගොවි ජනතාවට අසාධාරණයක් නොවන පරිදි එම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ හැකි වුවත්, එසේ කිරීමේ දී අක්කර 10-15 වංචනික ලෙස ලබා ගෙන ඇති ඉඩම් මේ සඳහා ලබා ගතහොත් ඒ සඳහා සාධාරණයක් ඉටු කිරීමට අපට කිසි දිනක පෙනී සිටිය නොහැකි බව දන්වා සිටින ලදී.

වග්‍රා සංග්‍රාමය සඳහා ත්‍රිවිධ හමුදාවේද දායකත්වය ලබා ගෙන, ගොවි ජනතාව ශක්තිමත් කර, රට ආහාරයෙන් ස්වයං පෝෂිත රටක් බවට පත් කර, පෙර දිග ධන්‍යාගාරය බවට පත් කර ගැනීමට හැකි වේවායි කියා සහ මේ සඳහා සියලුම දෙවි දේවතාවන්ගේ ආශිර්වාදය පිහිට ලැබේවායි ප්‍රාර්ථනා කරන ලදී.

අපගේ අනාගත දරු පරපුර රැක ගැනීමටත්, ජනතාව වෙනුවෙන් සිදු කරන්නා වු නිවැරදි යහපත් ක්‍රියාවන් සඳහා ගරු සභාපතිතුමාට තම සහාය ඉදිරියටත් ලබා දෙන බව ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමා, ගරු සභික ඩබ්.කේ. ටෂිත සමිල මහතා, චතුමිණි විජේනායක මෙනවිය හට 05.09 වන දින සිදු වු විනාශකාරී සිදුවීමට නැවත වරක් කණගාටුව ප්‍රකාශ කර සිටින අතර, එම සිදුවීමට සම්බන්ධ හානියට පත් වු සියලුම දෙනාට සාධාරණ වන පරිදි නීතිය ක්‍රියාත්මක වනු ඇතැයි බලාපොරොත්තුවෙන් සිටිමි. එසේම ගෝටා ගෝ ගම මයිනා ගෝ ගම අසරණ අරගලකරුවන්ට පහරදීම්වලට ලක් වු සියලු දෙනාටත් සාධාරණ වන පරිදි නීතිය ඉටු වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

❖ <u>ගරු ප්‍රාදේශීය සභා සභික, පී.එල්. චාලි ගුණරත්න මහතාගේ අදහස් දැක්වීම</u>

කොවිඩ්-19 තෙවන එන්නත් මාත්‍රාව ලබා ගැනීමට නොහැකි වු පිරිස් බොහොමයක් අප ප්‍රදේශවල සිටින බැවින්, එකී එන්නත ලබා දීමට වැඩපිළිවෙලක් සකස් කරන ලෙසට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී දැනුවත් කරන ලෙසට ඉල්ලා සිටින ලදී.

ආහාර නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා උද්ධකන්දර ප්‍රදේශයෙන් අක්කර 500 ලබා දීමට තීරණය වී තිබුණද, එම ප්‍රදේශයේ එපමණ භූමි ප්‍රමාණයක් ලබා දීමට නොමැත. එම ප්‍රදේශයේ බොහාමයක් පවතින්නේ පාරම්පරිකව ගොවිතැන් කටයුතු කළ ඉඩම්ය. මෙම ව්‍යාපෘතිය හේතුවෙන් එම පාරම්පරිකව වගා කළ ඉඩම්ද අහිමිවීමේ අවධානමක් පවතින බැවින්, මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙසට ඉල්ලා සිටින ලදී.

රටේ පවතින ආහාර හිඟයක් සමඟ කවුරුන්හෝ බෝගා වගා කිරීම ආරම්භ කරන්නේ නම්, ඒ සඳහා අපගේද කැමැත්තක් පවතී. නමුත් එලෙස වැඩපිළිවෙලක් ආරම්භ කිරීම නිශ්චිත ස්ථානයක් ලබා දිය යුතු බවත්, ඒ සඳහා පාරම්පරික ඉඩම් ලබා ගැනීමට කටයුතු නොකල යුතු බවත් දන්වා සිටින ලදී.

සභා වාර කිහිපයකදීම තමා විදුලි වැට සකස් කිරීම, ගොවි ජනතාවගේ ගොවි බිම් අහිමි වීම් ආදිය පිළිබඳව කතා කර, ඒ සම්බන්ධයෙන් විවිධ ආයතන සහ නිලධාරීන් වෙත දැන්වුවද, එම ආයතනයන්හි නිලධාරීන් මෙකී කරුණු පිලිබඳව සුළුවෙන් තකා කටයුතු කිරීම නිසා, එකී ගැටළු සඳහා මේ වන තෙක් විසඳුම් ලබා ගැනීමට නොහැකි වී ඇත.

පසුගිය සභා වාරයන්හි ජනතා විමුක්ති පෙරමුණ කාලයේ සභාපති ලෙස කටයුතු කළ, ජයසිරි මහතා හට මා දන්නා තරමින් රන්මිණිතැන්න ප්‍රදේශයේ ඉඩම් අක්කර 10-15 ක පමණ ප්‍රමාණයක් පවතිනු ඇත. එම නිසා මෙලෙස පවතින ඉඩම් සම්බන්ධයෙන් ද සොයා බලන ලෙසට දිස්ත්‍රික් ලේකම්තුමාට, ප්‍රාදේශීය ලේකම්තුමියට දන්වා යැවීම සුදුසු වන බව ප්‍රකාශ කරන ලදී.

සභාවේ මුරකරුවන් දෙදෙනෙක් විසින් සිදු කරන ලද ඩීසල් වංචාවේ දී, එම ඩීසල් ගරු සභිකවරුන් වෙත ලබා දෙනවා යනුවෙන් පළ වු පුවත වැරදි ආකාරයෙන් පල වී ඇති බවත්, අද දින මහා සභාවේ දී ගරු සභාපතිතුමා විසින් එලෙස පළ වු වැරදි පුවත හිරු නාලිකාව ඔස්සේ නැවත නිවැරදි කිරීමට මේ වන විට කටයුතු කර ඇති බවට දැන්වීම වෙනුවෙන් ස්තුතිය පුද කරන ලදී.

එසේම මාධ්‍යවේදීන් විසින් යම් පුවතක් පළ කරන්නේ නම්, වගකීමකින් යුතුව එය නිවැරදි ආකාරයෙන් සිදු කළ යුතුය. එසේ නොමැතිව වැරදි පුවතක් පල වුවහොත් එමගින් දැඩි හානියක් සිදු වනු ඇත. රටකට මාධ්‍යයක් තිබිය යුතුය. නමුත් එම මාධ්‍ය හරහා නිවැරදි පුවත් නිවැරදි ආකාරයෙන් පල කිරීමට මාධ්‍යවේදීන් වග බලා ගත යුතු බව ප්‍රකාශ කරන ලදී.

ලෝකයෙන්ම සරුසාර පසක්, නිල්වන් දිය, අවශ්‍ය භූමි භාගයන් සහ අවශ්‍ය ශ්‍රමය වැඩි වශයෙන්ම තිබෙන රටක් ලෙස අප ශ්‍රී ලංකාව හැඳින්විය හැකිය. මා මේ වන විට වයස්ගතව සිටියද, නිවසට අවශ්‍ය එළවලු, පළතුරු ආදිය මා විසින්ම වගා කර ඇත. වගාවන් සාර්ථකව සිදු කරන ගොවියෙක් ලෙස මා සියලුම ගරු සභිකවරුන්ගෙන් සහ ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලයෙන් ද ඉල්ලා සිටින්නේ රටේ පවතින ආහාර හිගය යම්තාක් දුරට හෝ අවම කිරීම සඳහා සියලුම දෙනා තම ගෙවත්තේ බෝග වගාව සුළුවට හෝ සිදු කිරීමට කටයුතු කරන ලෙසයි. එසේම සභාවේද මල් බඳුන්වල හෝ බෝග වගාවන් සිදු කළ හැකි නම් එය වඩාත් යෝග්‍ය වන බවත් දන්වා සිටින ලදී.

කොම්පෝස්ට් පොහොර යොදා තමාද වගාවන් සිදු කර ඇති අතර, එමගින් සාර්ථකත්වයක් ඇති වී ඇති බව සතුටින් සඳහන් කළ යුතුය.

2022.05.09 වන දින සිදු වූ ප්‍රචණ්ඩකාරී ක්‍රියාව මගින් මා ඇතුළු අප ප්‍රදේශයේ සිටින ගරු සභිකයින් වෙතද හානිකර තත්ත්වයන් ඇති කිරීමට සැලසුම් කර තිබුණද, මා ද මැදිහත් වී එම තත්ත්වය වළක්වා ගැනීමට කටයුතු කළ බව සඳහන් කරන ලදී.

05.09 වන දින සිදු වූ ප්‍රචණ්ඩකාරී සිදුවීම් වලින් ගරු සභාපතිතුමාටත්, ගරු සභික ඩබ්.කේ. ටෂිත සමිල මහතාටත්, චතුමිණි විජේනායක මෙනවියටත් සිදු වූ විනාශකාරී සිදුවීම් වෙනුවෙන් තමා නැවත වරක් කණගාටුව පල කරනවා සේම, අද දිනත් එම සිදුවීම්වලට සම්බන්ධ සියලුම දෙනාට එල විපාක මෙලොවදීම ලැබේවායි ප්‍රාර්ථනා කරන ලදී.

❖ <u>**අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා**</u>

<u>රන්මිණිතැන්න, උද්ධකන්දර ප්‍රදේශයන්හි ජනතා විමුක්ති පෙරමුණ පාලකයින් විසින් වංචනික ලෙස ලබා ගෙන ඇති ඉඩම් සම්බන්ධයෙන් වාර්තාවක් දිස්ත්‍රික් ලේකම් වෙතින් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.</u>

❖ <u>**ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතාගේ අදහස් දැක්වීම**</u>

පොසොන් පෝයට පසුව 05.09 වන දින සිදු වූ විප්ලවය සිදු වීමට ඉඩ තිබුණි නම්, බෞද්ධ දහම අනුව යම්තාක් දුරට හෝ මෙම විනාශකාරී සිදුවීම අපට වළක්වා ගැනීමට හැකි වනු ඇතැයි මාගේ විශ්වාසයයි.

රටේ පවතින තත්ත්වයත් සමඟ ඇති විය හැකි ආහාර හිඟය අවම කිරීම සඳහා වගා කටයුතු සිදු කිරීමට මේ දිනවල සැලසුම් කරයි. අප ප්‍රදේශය යනු ඈත අතීතයේ සිටම වගාවන් සිදු කරන ප්‍රදේශයෙකි. උද්ධකන්දර ප්‍රදේශයෙන් වගා කිරීම ඇති ඉඩම් වංචනික ලෙස බොහෝ පිරිස් අත්පත් කර ගෙන ඇති නිසා, එම ප්‍රදේශයේ පවතින එවැනි ඉඩම් නිදහස් කර ගනිමින් අපනයන ගම්මානයක් ඇති කිරීමට ගරු චමල් රාජපක්ෂ මැතිතුමා තීරණය කළ බව සඳහන් කරන ලදී.

කොච්චිපතාන, අමරවැව, සාමගුලිය වැව යන ප්‍රදේශවල වගා කරන වගා බිම් තිබුණද, පසුගිය රජය විසින් යම් යම් ව්‍යාපෘති සඳහා කොන්ත්‍රාත්කරුවන් වෙත එම ඉඩම් බදු දීමෙන් එම ඉඩම්වල තිබූ පලු, වීර, බුරුත වැනි විශාල ගස් කපා දමා විනාශ කර දමන ලදී. එම ව්‍යාපෘතීන්ට අමතරව කොන්ත්‍රාත්කරුවන් විසින් පලු, වීර, බුරුත වැනි ගස් කපා කුට්ටි කර පැටවීමට ද කටයුතු කරන ලදී. මේ නිසා බොහොමයක් අවශේෂ කැලෑ පමණක් ඇත. මෙවැනි ව්‍යාපෘති සිදු කිරීමේ දී විශාල ගස් කැපීම සම්බන්ධයෙන් සොයා බැලීමක් සිදු නොකළද, අසරණ ගොවි ජනතාවට ගොවිතැනක් සිදු කිරීම සඳහා වගා ලිදක්, නළ ළිදක් කපා ගැනීමට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් කිසිදු අවසරයක් ලබා නොදෙනු ඇත. මෙම සෑම සිදුවීමකින්ම අපගේ ගොවි ජනතාවට අසරණ තත්ත්වයකට පත් වීමට සිදු වනු ඇත.

අපගේ දිස්ත්‍රික්කයෙන් නව කෘෂිකර්ම සහ වනජීවී අමාත්‍යතුමා තේරී පත්ව සිටී. ගරු කෘෂිකර්ම ඇමති රටේ ජනතාවට බෝග වගාවන් සිදු කරන ලෙසට දැන්වුවද, වගාවන් සිදු කිරීම සඳහා අවශ්‍ය කරන බීජ වර්ග ඉතා අධික ලෙස මිල වැඩිවීමත් සමඟ ජනතාවට වගාවන් සිදු කිරීමට සඳහා හැකියාවක් නොපවතිනු ඇත. එසේම වගා කිරීම සඳහා අවශ්‍ය වන මැෂිං සහ ඉන්ධන නොමැතිකමත් වගාවන් සිදු කිරීමේදී ගැටළු ලෙස ඉස්මතු වනු ඇත. එම නිසා වගාවන් සිදු කිරීමට නම් ජනතාව මෙලෙස මුහුණපාන ගැටළු පිළිබඳව ගරු කාෂිකර්ම අමාත්‍යතුමා සමඟ සාකච්ඡා කිරීම සුදුසු වන බව ප්‍රකාශ කරන ලදී.

මේ වන විට සහල් ඇතුළු බඩුවල මිල ඉහල යාමත් සමඟ ජනතාව ඉතාමත් අසරණභාවයකට පත්ව ඇත. වෙළඳසැල්වල විවිධ විවිධ මිල ගණන් යටතේ බඩු අලෙවි කරනු ලබයි. එම නිසා මෙවැනි වෙළඳසැල් සම්බන්ධයෙන්ද සොයා බැලිය යුතු බව ප්‍රකාශ කරන ලදී.

අද දින ජනතාව වෙනුවෙන් ඇප කැප වී සේවය කරන මහජන නියෝජිතයින්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ ලබා දෙන ලෙසට ආකෘති පත්‍රයක් අප වෙතට ලබා දී තිබුණද, විවිධ මාපියාවන් සිදු කර වත් පොහාසත් වී, දියුණු වී සිටින රාජ්‍ය නිලධාරීන් ද සිටින බැවින්, එම නිලධාරීන්ගෙන්ද වත්කම් බැරකම් ප්‍රකාශ ලබා ගැනීමට කටයුතු කළ යුතු බව ප්‍රකාශ කරන ලදී.

අමරවැව, සාමිගුලිය වැව යන ප්‍රදේශයන්හි පාරම්පරිකව ගොවි ජනතාව අහස් දියෙන් ගොවිතැන් කටයුතු කරනු ලබයි. අමරවැව ප්‍රදේශය ගල් තලාවක පවතින භූමියක් වන බැවින්, තණ බිමක් ලෙස නම් කළද, ගල් තලාවක භූමිය පවතින නිසා, තණ කොළ වැවීමක් සිදු කළ නොහැක. අහස් දියෙන් ගොවිතැන් කටයුතු කරන අසරණ ගොවි ජනතාවක් අප ප්‍රදේශයේ අසරණව ජීවත් වන බව සඳහන් කළ යුතුය.

කෘෂිකර්ම කමිටුව සඳහා අප ප්‍රදේශයෙන්ද ජනතාව සම්බන්ධ වී ඇත. ඒ සඳහා වනජීවී දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවද සම්බන්ධ වී ඇති අතර, එහිදී ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශ කර ඇත්තේ, ජනතාව සඳහා ගොවිතැන් කටයුතු කරන ඉඩම් සඳහා බලපත්‍රයක් ලබා නොදී, ගොවිතැන් කිරීම සඳහා අවසරය ලබා දෙන ලෙස දැන්වුවද, එම නිලධාරීන් ගමට පැමිණ ප්‍රකාශ කරනු ලබන්නේ ගොවිතැන් කිරීම සඳහා අවසර ලබා නොදෙන බවයි. එසේම එම නිලධාරීන් කැලෑවෙන් දර කැඩීම තහනම් කළද, දැනට ගෑස් නොමැතිකම නිසා ජනතාව කැලෑබද ප්‍රදේශයෙන් දර කෝටු ගෙන ඒමට කටයුතු කරනු ලබයි.

රට මේ වන විට දැඩි ආර්ථික අර්බුදයකට පත්ව ඇත. රටේ එළවලු, පළතුරු ඉතාමත් අධික ලෙස මිල ඉහල ගොස් ඇති කාලයක් තුළ ඇතැම් මිනිසුන් ආහාර ඉතුරු වී අපතේ ගියත් ආහාර නොමැති කෙනෙකුට දීමක් සිදු නොකිරීමෙන් සිතා ගත හැක්කේ අප රට තුළ බෙදා හදා ගැනීමක් තවමත් නොමැති බවයි.

රට තුළ පැවැති කුරිරු යුද්ධයෙන්, කොරෝනා වෛරස් රෝගී තත්ත්වයෙන් ජය ගැනීමට අපට හැකි විය. එසේම බෝග වගා දැනට ආරම්භ කළහොත්, කාලයක් ගිය පසුව එහි සාර්ථකත්වයක් ලබා ගෙන ආහාර හිඟයෙන්ද අප රටට ජය ගත හැකි බව ප්‍රකාශ කරන ලදී.

❖ <u>ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතාගේ අදහස් දැක්වීම</u>

සභාවේ සිදු වූ ඩීසල් වංචාව සම්බන්ධායන් ගරු සභිකවරුන්ද සම්බන්ධ කර ගනිමින් පළ වූ මාධ්‍ය පුවත නිසා ගරු සභිකයින් පත් වූ අපහසුතාවයට මාගේ දැඩි කණගාටුව පල කරන ලදී. එසේම වැරදි ලෙස පල වූ එම පුවත් කඩිනමින් නිවැරදි කිරීමට කටයුතු කරන බව ප්‍රකාශ කරන ලදී.

ජනතා විමුක්ති පෙරමුණ පාලන කාලයේ හිටපු සභාපතිවරයෙක් විසින් රන්මිණිතැන්න, උද්ධකන්දර වැනි ප්‍රදේශවලින් අක්කර 10-15 ක් වැනි විශාල ප්‍රමාණයන් වංචනික ලෙස ලබා ගෙන

ඇති බවට කරුණු දැන ගැනීමට ලැබී ඇති බැවින්, මෙලෙස වංචා ලෙස ලබා ගෙන ඇති ඉඩම් පිළිබඳව සොයා බැලිය යුතුය.

ග්‍රාම සේවා වසමක් තුළ, එකී වසමට අදාළ කටයුතු සොයා බලා ඉටු කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් 05 දෙනෙක් සිටියද, එම නිලධාරීන් අතින් සිදු විය යුතු රාජකාරී නිසි ලෙස ඉටු නොවීම මත, ප්‍රදේශයෙන්හි ඇතැම් ගැටළුකාරී තත්ත්වයන් උද්ගත වන බව ප්‍රකාශ කරන ලදී. රට තුළ සිදුවන සෑම සිදුවීමකටම දේශපාලන නායකයින් වගකිව යුතු නොවේ. දේශපාලන නායකයින් යම් තීරණයක් ගනු ලැබුවද, ඒවා ක්‍රියාත්මක කිරීම කළ යුත්තේ රාජ්‍ය නිලධාරීන් විසින්ය. රාජ්‍ය නිලධාරීන් අතින් සිදු විය යුතු සේවාවන් නිසි පරිදි වගකීමෙන් යුතුව ඉටු වන්නේ නම්, ප්‍රදේශයන්හි ඇති වන ගැටළු යම්තාක් දුරට අඩු කර ගත හැකි බව ප්‍රකාශ කරන ලදී.

ජනතාව වෙනුවෙන් සේවයක් කිරීමට සිටින මහජන නියෝජිතයන්ගෙන් වත්කම් බැරකම් ප්‍රකාශ ලබා ගැනීමට කටයුතු කරන්නේ නම්, තම රාජකාරිය නිසි ලෙස ඉටු නොකර,විවිධ මාපියාවන් සිදු කරමින්, වැටුප් ලබා ගැනීමට පමණක් රැකියාව කරන රාජ්‍ය නිලධාරීන්ගේ ද වත්කම් බැරකම් ප්‍රකාශ ලබා ගැනීමට කටයුතු කළ යුතු බවත් දන්වා සිටින ලදී.

තණ බිම් ලබා ගැනීම සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ දී සෑම අවස්ථාවකම යෝජනා ඉදිරිපත් කර ඒ පිලිබඳව සාකච්ඡා කළද, ඒ සඳහා ක්‍රියාත්මක වීමක් සිදු නොවන්නේ රාජ්‍ය නිලධාරීන්ගේ රාජකාරී නිසි ලෙස ඉටු නොවීම මත බව කිව හැකිය.

2022.05.09 වන දින සිදු වූ ප්‍රචණ්ඩකාරී සිදුවීමෙන් මාගේ නිවස, වාහන කුඩු කර දැමීමට කටයුතු කරන ලදී. මාගේ නිවස සාදා ගන්නා ලද්දේ, වාහන ලබා ගන්නා ලද්දේ දේශපාලනයට පිවිසීමට පෙර කාලයේ දීය. මේ සියල්ල මාගේ දහඩිය මහස්සියෙන් මාගේ ව්‍යාපාර වලින් හරි හම්බ කර ගත් මුදලින් බවත්, මේ කිසිවක් මා දේශපාලනයෙන් ලබා ගත් දේවල් නොවන බව සඳහන් කළ යුතුය.

එදින ප්‍රචණ්ඩකාරී ක්‍රියාවට බොහොමයක් සම්බන්ධ වී ඇත්තේ තරුණ දරුවන්ය. දිසාපා, හයස්ටඩි උපකාරක පන්ති තුළින් දරුවන්ට දේශපාලනය උගන්වා, දරුවන්ගේ මනස විකෘති කර, ඔවුන් මෙම අරගලය සඳහා පොළඹවා ගෙන ඇති බව සඳහන් කරන ලදී.

අප සභාවේ සියලුම ගරු සභිකයින් සහෝදරයින් සේ එකට හිද අප ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් කටයුතු කරන ලදී. අප සෑම අවස්ථාවකම ජනතාව වෙනුවෙන් කටයුතු කරන පිරිසක් මිසක, දේශපාලනයෙන් කිසි දිනක අප හරි හම්බ කර ගත දෙයක් නොමැති බව දන්වා සිටින ලදී. එසේම විවිධ ව්‍යසන හමුවේ ජනතාව වෙනුවෙන් සහන මිලට එළවලු මලු ලබා දීම, කොවිඩ්-19 එන්නත් ලබා දීම, කොවිඩ් හමුවේ නිරෝධායනය වන පවුල් සඳහා සහන මලු ලබා දීම ආදිය සිදු කරන ලද්දේ ජනතාව වෙනුවෙන් බව ප්‍රකාශ කර සිටින ලදී.

මේ දිනවල වගාවන් සිදු කිරීම සඳහා අවශ්‍ය කරන පොහොර, දියර පොහොර, කෘමිනාශක සහ හාල් ඇතුළු අවශ්‍ය සියලුම ද්‍රව්‍යවල මිල ඉතාමත් අධික මුදලකට අළෙවි කරනු ලබයි. මෙසේ ජනතාව අසරණ වන ආකාරයට අධික මිලකට බඩු අලෙවි කරන වංචාකරුවන් සඳහා ගල් ගැසීමක් සිදු නොකර, ජනතාව වෙනුවෙන් නොකා නොබී, දිවා රෑ නොබලා වෙසෙ වී කටයුතු කරන අපටම ගල් ගැසීමට කටයුතු කිරීම අපගේ සිත්වලටද ඉතාමත් කණගාටුදායක තත්ත්වයක් ඇති කරන්නාවූ සිදුවීමක් බව කිව යුතුය.

2022.05.09 වන දින සිදු වූ ප්‍රචණ්ඩකාරී ක්‍රියාව ජනතා විමුක්ති පෙරමුණ පක්ෂය විසින් සහ ව්‍යාපාරික ආයතන, පිනැන්ස් ආයතන එක්ව සිදු කරන ලද විනාශකාරී සිදුවීමකි. අප හා එකට සිටි පුද්ගලයින්ම මෙම සිදුවීමට සම්බන්ධ වී තිබීමත් සිතා ගත නොහැකි කරුණකි. කෙසේ නමුත්, මෙම සිදුවීමට සම්බන්ධ සියලුම දෙනාට නීතිය ක්‍රියාත්මක වී දේපළ හානි වූ අප හට සාධාරණයක් ඉටු විය යුතු බව ප්‍රකාශ කර සිටින ලදී.

ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් සිදු කර හෝ අපගේ දේශපාලන ගමන නතර කිරීමට සිත්න්නේ නම්, එය කිසි දිනක සිදු නොවන දෙයකි. සිදු වූ මෙම සෑම සිදුවීමකින්ම පන්නරය ගෙන, ඉදිරියටත් අප දේශපාලනය වෙනුවෙන් ජනතාවට සේවයක් කිරීමට ඇප කැප වී කටයුතු කරන බව වගකීමෙන් යුතුව සඳහන් කරන ලදී.

1988-1989 වර්ෂයන්හි ඇති වූ භීෂණ තත්ත්වයේදී ජනතා විමුක්ති පෙරමුණ නායකයින් සැංගී සිටියා සේම, අදටත් මෙම ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් මෙහෙයවන ලද ජනතා විමුක්ති පෙරමුණ නායකයින් සැංගී ඒ සඳහා පොළඹවා ගත් පාසල් දරුවන් අද වන විට නීතියේ රැහැනට අසු වී ඇත. මෙම සිදුවීම සඳහා බොහොමයක් සම්බන්ධ වී ඇත්තේ දිසාපා, හයස්ටඩ් ආයතනවල උපකාරක පන්ති සඳහා සහභාගී වූ සාමාන්‍ය පෙළ, උසස් පොළ දරුවන් බව ඉතාමත් කණගාටුවෙන් ප්‍රකාශ කළ යුතුය.

මා ඇතුළු ගරු සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතාටත්, චතුමිණි දිල්ෂානි මෙනවියගේ නිවෙස් සඳහා සිදු වූ විනාශකාරී සිදුවීම කිසි දිනක සාධාරණීකරණය කළ නොහැක. එම නිසා මෙම සිදුවීමට සම්බන්ධ මහ මොළකරුවන්ගේ සිට සියලුම දෙනාට නීතිය සාධාරණ වන පරිදි ක්‍රියාත්මක කළ යුතුය. එසේම මෙම ප්‍රචණ්ඩකාරී ක්‍රියාව මෙහෙය වන ලද සාමාජ මාධ්‍ය ජාලය මේ වන විටත් ක්‍රියාත්මක තත්ත්වයේ පවතින බැවින්, මෙම සමාජ මාධ්‍ය ජාලයද වහාම නවතා දැමීමට කටයුතු කළ යුතු බවත් දන්වා සිටින ලදී.

එසේම 2022.05.09 වන දින සිදු වූ ප්‍රචණ්ඩකාරී ක්‍රියාවට සම්බන්ධ ජනතා විමුක්ති පෙරමුණ පක්ෂයේ ගරු සභිකයින් 03 දෙනාම ත්‍රස්ථවාදී ක්‍රියාවන් සිදු කරන ලද ත්‍රස්ථවාදීන් සේ සලකා කටයුතු කළ යුතු බවට පාර්ලිමේන්තුවේ සම්මත කර ගැනීමට අදාළ කටයුතු කළ යුතු බවටත් දන්වා සිටින ලදී.

අද දින මහා සභාව සාර්ථකව පවත්වාගෙන යාමට සහාය ලබා දුන් ගරු උප සභාපති, ගරු ප්‍රාදේශීය සභා සභිකයින්ට හා මාධ්‍යවේදීන් දෙපල, ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරී මහත්මියටත්, ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ස්තුතිය පුද කිරීමෙන් අනතුරුව ප.ව. 02.45 ට පමණ මහා සභාවේ කටයුතු අවසන් කරන ලදී.

වාර්තා කළේ - ඩී. රුවිනා දීපානි,
ලේකම්,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.

සභාපති,
ඩබ්ලිව්.ජී. උපුල්,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.

2022.06.16 දින තිස්සමහාරාම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.